මුදල් විශුද්ධිකරණය වැළැක්වීම,
ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම
සහ
සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය
මැඩ පැවැත්වීම පිළිබඳ
ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්තිය

2026 - 2030

පටුන

අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2

අතිගරු ජනාධිපතිතුමාගේ පණිවුඩය 3

ජාතික සම්බන්ධීකරණ කමිටු සභාපතිතුමාගේ පණිවුඩය 5

1. හැඳින්වීම 7

2. මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (2026 - 2030) 9

2.1. ජාතික අවදානම් ඇගැයීම 2024/25 9

2.2. ප්‍රවේශය 13

2.3. මූල්‍ය කාර්යසාධක බලකා ප්‍රමිතිවලට අනුකූල වීම සහ ආසන්නතම ප්‍රතිඵල 14

2.4. මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියෙහි අරමුණු 15

2.5. මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියෙහි මූලධර්ම 29

3. නෛතික රාමුව 30

4. ජාතික සම්බන්ධීකරණය 30

5. නියාමන රාමුව 30

6. නීතිය බලාත්මක කිරීමේ රාමුව 31

7. අනෙකුත් රාජ්‍ය පාර්ශ්වකරුවන් 32

8. වාර්තා කිරීමේ ආයතන 32

9. ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීමේ සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීමේ පාලන ව්‍යුහය 34

10. නිගමනය 35

අමාත්‍ය මණ්ඩල අනුමැතිය

2026.07.13 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී, අමාත්‍ය මණ්ඩලය විසින් 2026-2030 කාල පරිච්ඡේදය සඳහා ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීම (AML/CFT/CPF) පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය අනුගමනය කිරීමට අනුමත කර ඇත.

අතිගරු ජනාධිපතිතුමාගේ පණිවුඩය

ශ්‍රී ලංකා රජය, රටේ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සහ ඒකාග්‍රතාව ආරක්ෂා කර ගැනීම සඳහා අඛණ්ඩ ව කැපවී සිටී. මුදල් විශුද්ධිකරණය (ML), ත්‍රස්තවාදයට මුදල් සැපයීම (TF) සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනයට (PF) එරෙහිව ජාතික රාමුව ශක්තිමත් කිරීම, අපගේ ආර්ථිකය ආරක්ෂා කර ගැනීම සහ ජාත්‍යන්තර හවුල්කරුවන්ගේ විශ්වාසය පවත්වා ගෙන යෑම සඳහා අත්‍යවශ්‍ය ජාතික ප්‍රමුඛතාවක් වනු ඇත.

මෙවන් පසුබිමක් තුළ, ඉදිරි වසර පහ පුරා මූල්‍ය අපරාධ අවම කිරීමට ශ්‍රී ලංකාවේ උපායමාර්ගික දිශානතිය සඳහා මඟ පෙන්වීමට 2026 -2030 කාලපරිච්ඡේදය සඳහා ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සංවර්ධනය කර ඇත. මෙම ජාතික ප්‍රතිපත්තිය, 2024/25 ජාතික අවදානම් ඇගැයීමෙහි සොයාගැනීම් මත පදනම්ව සකස් කර ඇති අතර, එමගින් කඩිනම් සහ සම්බන්ධීකරණ ක්‍රියාමාර්ග අවශ්‍ය වන, මතු වන තර්ජන සහ ව්‍යුහාත්මක අවදානම්වලට නැඹුරුවීමට ඇති හැකියාව හඳුනාගෙන ඇත. රජය විසින් මෙම ජාතික ප්‍රතිපත්තිය අදාළ සියලු ආයතන තුළ අනුගමනය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට මෙන් ම, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීම පිළිබඳ ඔවුන්ගේ අදාළ ආයතනික ක්‍රියාකාරී සැලසුම් යාවත්කාලීන කිරීමට පූර්ණ වශයෙන් කැප වී සිටියි. ආයතනික වශයෙන් මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීම පිළිබඳ ක්‍රියාකාරී සැලසුම් සමීපව අධීක්ෂණය කිරීම සඳහා රජය විසින් මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීම පිළිබඳ කාර්යසාධන බලකායක් දැනටමත් පිහිටුවා ඇත. මෙම කාර්යසාධන බලකාය ආයතනික ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම මගින් 2026 – 2030 කාලපරිච්ඡේදය සඳහා වන ජාතික ප්‍රතිපත්තියට අඛණ්ඩ ව සහාය ලබා දෙනු ඇත. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා ලෙස, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීමේ ක්‍රියාකාරී සැලසුම්වල ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය අධීක්ෂණය කිරීම සඳහා පවතින කැපවීම පිළිබිඹු කරමින්, මා අදාළ පාර්ශ්වකරුවන් අවස්ථා ගණනාවක දී හමු වී ඇත.

ශ්‍රී ලංකාව, මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය වැළැක්වීම සඳහා ක්‍රියාකරන අන්තර්රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදන ආයතනයක් වන මූල්‍ය කාර්යසාධක බලකාය (FATF) සහ මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායම (APG), මෙන් ම කලාපීය හවුල්කරුවන් සමඟද සමීපව සහයෝගයෙන් කටයුතු කරමින්, සිය මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීමේ අනුකූලතාව ශක්තිමත් කිරීමට සහ ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේදවලට අනුකූල වීමට අඛණ්ඩ ව ක්‍රියා කරනු ඇත. ශ්‍රී ලාංකික ආර්ථිකයෙහි සියලු අංශ ආවරණය වන පරිදි හඳුනාගත් ඌණතා සඳහා පිළියම් යෙදීමට, විනිවිදභාවය වැඩිදියුණු කිරීමට සහ සඵලදායී, අවදානම පදනම් කරගත් මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීමේ රාමුවක් ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම සහයෝගීතා ප්‍රවේශය අත්‍යවශ්‍ය වේ.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීම පිළිබඳ මෙම ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, ශ්‍රී ලංකාවේ පුළුල් පාලනය, මූල්‍ය අංශ ප්‍රතිසංස්කරණ සහ ආර්ථික ස්ථායීකරණ කර්තව්‍යයන් සඳහා සහාය ලබා දීමේ දී ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරන බවද විශේෂයෙන් සඳහන් කළ යුතුය. සඵලදායී මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීමේ ක්‍රියාමාර්ග, ආයෝජක විශ්වාසය වැඩිදියුණු කිරීම, රාජ්‍ය මූල්‍ය විශ්වසනීයත්වය සඳහා සහාය ලබා දීම හා ගෝලීය මූල්‍ය පද්ධතිය තුළ රටේ කීර්තිනාමය ශක්තිමත් කිරීම සඳහා ඍජු වශයෙන් දායක වනු ඇත.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීම පිළිබඳ මෙම ජාතික ප්‍රතිපත්තිය මගින් සියලු ම ශ්‍රී ලාංකිකයන් සඳහා සුරක්ෂිත සහ ශක්තිමත් මූල්‍ය පරිසරයක් තහවුරු කිරීම උදෙසා පවතින සාමූහික කැපවීම නියෝජනය කෙරෙයි. රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතනවල අඛණ්ඩ කැපවීම, සහයෝගීතාව සහ වෘත්තීයභාවය මත එහි සාර්ථකත්වය රඳා පවතිනු ඇත. ජාතියේ සහ ජනතාවගේ යහපත උදෙසා, මෙම ජාතික ප්‍රතිපත්තිය ඵලදායීව හා කාලෝචිතව ක්‍රියාත්මක කිරීම සඳහා සිය උපරිම සහයෝගය සහ දායකත්වය ලබාදෙන ලෙස මම සියලු පාර්ශ්වකරුවන්ගෙන් ඉල්ලා සිටිමි.

අනුර කුමාර දිසානායක
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික, සමාජවාදී ජනරජයේ ජනාධිපති සහ
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන, ඩිජිටල් ආර්ථිකය පිළිබඳ අමාත්‍ය

ජාතික සම්බන්ධීකරණ කමිටු සභාපතිතුමන්ගේ පණිවුඩය

2026-2030 කාල පරිච්ඡේදය සඳහා ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මා ඉදිරිපත් කරනුයේ මහත් ප්‍රශංසාවෙන් සහ වගකීමෙනි. මෙම ජාතික ප්‍රතිපත්තිය කාලෝචිත ව සංවර්ධනය කිරීම මගින් ඉහළ යන සංකීර්ණ ගෝලීය පරිසරය තුළ රටේ මූල්‍ය අංශවල ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීමට සහ මතු වන අවදානම් සඳහා පිළියම් යෙදීම සඳහා ශ්‍රී ලංකාවේ අඛණ්ඩ කැපවීම පිළිබිඹු කෙරෙයි.

පසුගිය වසර කිහිපය පුරා, ශ්‍රී ලංකාව මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය යන අවදානම්වල ස්වභාවය සහ පරිමාණය අවබෝධ කර ගැනීම සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගෙන ඇත. 2024/25 ජාතික අවදානම් ඇගැයීම මගින් මෙම අවදානම් පිළිබඳ සම්පූර්ණ සහ සාක්ෂි පදනම් කරගත් අවබෝධයක් සපයා ඇති අතර, එහි සොයා ගැනීම් මගින් 2026-2030 කාල පරිච්ඡේදය සඳහා මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීම පිළිබඳ මෙම ජාතික ප්‍රතිපත්තියේ මූලික පදනම සකස් කරනු ලබයි. මෙම ජාතික ප්‍රතිපත්තිය මගින් සංශෝධිත ජාතික අවදානම් පැතිකඩ සලකා බලමින් ප්‍රතිසංස්කරණය කළ යුතු ප්‍රමුඛතා අංශ දක්වා ඇත. මෙම ජාතික ප්‍රතිපත්තිය සම්පාදනය කිරීමේ දී, ඉහළ තර්ජන, අවදානම් මෙන් ම ඉහළ අවදානම් සහිත අංශ සඳහා විශේෂ අවධානයක් යොමු කර ඇත. එමගින් සියලු අංශයන්හි අවදානම් අවම කිරීම සඳහා ක්‍රමානුකූල සහ පැහැදිලි රාමුවක් සකස් කරනු ලබයි.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීම පිළිබඳ මෙම ජාතික ප්‍රතිපත්තිය සංවර්ධනය කිරීම, නියාමකයන්, අධීක්ෂණ බලධාරීන්, නීතිය බලාත්මක කිරීමේ නියෝජිත ආයතන, වාර්තා කිරීමේ ආයතන සහ අනෙකුත් නිසි බලධාරීන් ඇතුළු ප්‍රධාන රාජ්‍ය සහ පෞද්ගලික අංශයන්හි පාර්ශ්වකරුවන්ගේ සහයෝගී ප්‍රයත්නයකි. ජාතික අවදානම් ඇගැයීම සඳහා ඔවුන් විසින් තොරතුරු, දත්ත, විශේෂඥ දැනුම සහ සක්‍රිය සහභාගීත්වය මඟින් ලබාදුන් දායකත්වය, ප්‍රායෝගික මෙන් ම ඉදිරි දැක්මක් සහිත ප්‍රතිපත්ති රාමුවක් ගොඩනැංවීමේ දී අත්‍යවශ්‍ය වූවකි.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීම පිළිබඳ මෙම ජාතික ප්‍රතිපත්තියෙහි සාර්ථකත්වය බොහෝ දුරට එහි කාර්යක්ෂම ක්‍රියාත්මක කිරීම මත රඳා පවතී.

ඒ සඳහා ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීම පිළිබඳ පාලන තන්ත්‍රය වැඩිදියුණු කිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිති සමග අඛණ්ඩ නෛතික අනුකූලත්වය, ශක්තිමත් පාලන රාමු, සඵලදායී සම්බන්ධීකරණය, ශක්තිමත් අවදානම් පාදක අධීක්ෂණය, විමර්ශන හා වත්කම් ප්‍රතිසාධන හැකියාවන් වැඩිදියුණු කිරීම, දත්ත යටිතල පහසුකම් වර්ධනය, නව තාක්ෂණය අනුගමනය කිරීම, ශක්තිමත් සයිබර් ආරක්ෂණය, සුරක්ෂිත ඩිජිටල් හඳුනා ගැනීමේ පද්ධති, අතථ්‍ය වත්කම් සේවා සපයන්නන් නියාමනය, අවදානම්-සමතුලිත මූල්‍ය අන්තර්ගතභාවය සහ පාර්ශ්වකරුවන්ගේ අඛණ්ඩ කැපවීම පවත්වා ගෙන යෑම අත්‍යවශ්‍ය වේ. තව ද, මෙම ප්‍රතිපත්තිය පාලන ක්‍රමවේද ශක්තිමත් කිරීම, මූල්‍ය විනිවිදභාවය වැඩිදියුණු කිරීම සහ මූල්‍ය කාර්යසාධක බලකාය විසින් නියම කර ඇති ජාත්‍යන්තර ප්‍රමිතීන් සමග අනුකූලතාවය ශක්තිමත් කිරීමට ශ්‍රී ලංකාව විසින් ගනු ලබන පුළුල් ප්‍රයත්නයන්ට ද අනුකූල වේ.

ජාතික අවදානම් ඇගැයීම සහ ජාතික ප්‍රතිපත්ති සංවර්ධන ක්‍රියාවලිය සම්බන්ධීකරණයෙහිලා නායකත්වය ලබාදුන් ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකයට මෙන්ම, තම තාක්ෂණික විශේෂඥ දැනුම සහ සහයෝගිතාව මඟින් දායකත්වය ලබාදුන් සියලු ආයතන වෙත ද මාගේ හෘදයාංගම කෘතඥතාව පළ කරමි. ඔවුන්ගේ කැපවීම, ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ ආරක්ෂාව සහ අඛණ්ඩතාව පවත්වා ගැනීම සඳහා ඇති පොදු කැපවීමක් පිළිබිඹු කරයි.

අපගේ ඉදිරි ගමනත් සමග, මෙම ජාතික ප්‍රතිපත්තිය සඵලදායී ව ක්‍රියාත්මක කිරීම සඳහා එක්ව කටයුතු කරන මෙන් මම සියලු ම පාර්ශ්වකරුවන්ගෙන් ඉල්ලා සිටිමි. මැනවින් ක්‍රියාත්මක වන මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීමේ රාමුවක් මූල්‍ය පද්ධතිය ආරක්ෂා කිරීම සඳහා පමණක් නොව, දිගු කාලීන ආර්ථික ස්ථායීතාව, ආයෝජක විශ්වාසය සහ ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාව සඳහා ද අතිශය වැදගත් වේ.

ආචාර්ය නන්දලාල් වීරසිංහ

ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම **පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුවේ සභාපති**

1. හැඳින්වීම

මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය වැනි මූල්‍ය අපරාධ ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සහ ගෝලීය මූල්‍ය පද්ධතියට දැඩි තර්ජන එල්ල කරයි. ශීඝ්‍ර තාක්ෂණික වර්ධනයත් සමග, මූල්‍ය ගනුදෙනු වඩාත් සංකීර්ණභාවයට පත් වී ඇත. අපරාධකරුවන් අපරාධවලින් උත්පාදිත දැ සැඟවීමට දියුණු ක්‍රම භාවිත කරයි. මෙමගින් බලධාරීන්ට මෙම මූල්‍ය ජාලා වළක්වා ගැනීම, හඳුනා ගැනීම සහ ඒවා අවහිර කිරීම අසීරු කරවයි. එමෙන්ම, මුදල් විශුද්ධිකරුවන් නීති විරෝධී ලෙස උත්පාදිත දැ වෙත පිවිසීම සහ ත්‍රස්තවාදයට මුදල් සපයන්නන් අරමුදල් ලබා ගැනීම වැළැක්වීම ද අභියෝගාත්මක වේ.

මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය පිළිබඳ අවදානම් අවම කිරීමට සඵලදායී වූ සම්බන්ධීකරණයක් අවශ්‍ය වේ. ඒ සඳහා නියාමන බලධාරීන්, අධීක්ෂණ ආයතන, මූල්‍ය බුද්ධි ඒකකය, නීතිය බලාත්මක කිරීමේ නියෝජිත ආයතන, නඩු පවරන බලධාරීන් සහ අධිකරණය ඇතුළු ව, මූල්‍ය පද්ධතිය තුළ සිටින සියලු ම පාර්ශ්වකරුවන් සහයෝගයෙන් කටයුතු කළ යුතු ය. මූල්‍ය පද්ධතියේ ඒකාග්‍රතාව සහ ස්ථායීතාව තහවුරු කිරීම සඳහා මෙම ආයතන අතර ශක්තිමත් සහයෝගීතාවය සහ ව්‍යුහාත්මක සම්බන්ධීකරණය අතිශය වැදගත් වේ. එවැනි යාන්ත්‍රණයන් මගින් දේශීය සම්බන්ධීකරණයෙහි සඵලදායීත්වය තහවුරු කරනු ඇති අතර, ප්‍රතිපත්තිමය සහ මෙහෙයුම් යන දෙ අංශයෙන් ම කාලෝචිත ව තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා සහාය සලසනු ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස, මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනයට එරෙහි ව ගනු ලබන ක්‍රියාමාර්ග ස්ථාපිත කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට සහාය සැලසෙනු ඇත.

ශ්‍රී ලංකාව විසින් මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනයට අදාළ අවදානම් සඳහා සඵලදායී ව පිළියම් යෙදීමට ශක්තිමත් ජාතික රාමුවක් පිහිටුවීම අත්‍යවශ්‍ය වේ. එවැනි රාමුවක් මගින් ජාත්‍යන්තර නිර්දේශ සහ හඳුනාගත් මනා ක්‍රමවේදයන්ට අනුකූල ව, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීමේ වගවීම් සමග පූර්ණ වශයෙන් අනුකූල වීම සහතික කළ යුතු ය.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීමේ සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීමේ සඵලදායී රාමුවක් පිහිටු වීම සඳහා ශ්‍රී ලංකාව විසින් සිය පරිචය තුළ මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය පිළිබඳ අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම සහ අවබෝධ කර ගැනීම ක්‍රමානුකූලව සහ අඛණ්ඩව සිදු කරනු ලැබිය යුතු ය. මෙම අවශ්‍යතාවය ඉටු කරමින්, ශ්‍රී ලංකාව මෙතෙක් ජාතික අවදානම් ඇගැයීම් තුනක් සිදුකර ඇත. 2024/25 කාල පරිච්ඡේදය තුළ සිදු කළ ජාතික අවදානම් ඇගැයීම නවතම ඇගැයීම වේ.

එම නවතම ජාතික අවදානම් ඇගැයීමෙහි සොයා ගැනීම් සහ ජාතික ප්‍රමුඛතා මත පදනම් ව, ශ්‍රී ලංකාව 2026-2030 කාල පරිච්ඡේදය සඳහා මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්පාදනය කර ඇත.

මෙම ජාතික ප්‍රතිපත්තිය, 2024/25 ජාතික අවදානම් ඇගැයීම ඔස්සේ හඳුනා ගත් තර්ජන, අවදානම්වලට නැඹුරු වීමට ඇති හැකියාව සහ අවදානම් සඳහා පිළියම් යෙදීමට නිර්මාණය කර ඇත. ඉදිරි වසර පහ තුළ එය සාර්ථක ව ක්‍රියාත්මක කිරීම, ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීමේ සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීමේ රාමුව ශක්තිමත් කිරීමට සහ රටේ මූල්‍ය පද්ධතියෙහි සහ ජාතික ආරක්ෂාවෙහි ඔරොත්තු දීමේ හැකියාව සහ ඒකාග්‍රතාව තහවුරු කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ.

මෙම ජාතික ප්‍රතිපත්තිය අඛණ්ඩ අදාළත්වය සහ ඵලදායීත්වය තහවුරු කිරීම සඳහා ක්‍රමානුකූල සමාලෝචනයකට යටත් වනු ඇත.

2. ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (2026 - 2030)

මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීම පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්තිය (2026 - 2030) 2024/25 ජාතික අවදානම් ඇගැයීමෙහි සොයා ගැනීම් මත පදනම් ව සම්පාදනය කළ අතර, රටේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීමේ සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීමේ රාමුව තුළ හඳුනා ගත් ප්‍රධාන ව්‍යුහාත්මක දුර්වලතා, අවදානමට ලක් වීමට ඇති හැකියාව සහ උපායමාර්ගික පරතර සඳහා පිළියම් යෙදීමේ අවශ්‍යතාවය අවධාරණය කරයි. එය මූල්‍ය කාර්යසාධක බලකායේ ප්‍රමිතීන්වලට අනුකූලව, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීමේ සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීමේ වඩාත් ශක්තිමත් සහ සඵලදායී රාමුවක් ගොඩනැඟීම සඳහා පැහැදිලි ප්‍රමුඛතා සහ ක්‍රියාමාර්ග සපයයි.

2.1 ජාතික අවදානම් ඇගැයීම 2024/25

2024/25 ජාතික අවදානම් ඇගැයීම පෙර ඇගැයීමට සමාන ව ලෝක බැංකු ක්‍රමවේදය භාවිත කරමින් සිදු කරන ලදී. රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන 86ක් නියෝජනය කරමින් 200කට ආසන්න ප්‍රවීණයන්ගේ සහභාගීත්වය ඇති ව මෙම ඇගැයීම සිදු කෙරිණි. මූල්‍ය බුද්ධි ඒකකය ජාතික අවදානම් ඇගැයීමෙහි සම්බන්ධීකරණ කාර්යය මෙහෙයවනු ලැබීය. මෙම ජාතික අවදානම් ඇගැයීම, වෙළෙඳපොළ දෘෂ්ටිකෝණ සහ මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය පිළිබඳ ගෝලීය සහ කලාපීය අවදානම් සලකා බැලීම මගින් වැඩිදියුණු කරන ලදී.

2024/25 ජාතික අවදානම් ඇගැයීම ට අනුව ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය පිළිබඳ සමස්ත අවදානම 1 වන රූපසටහනෙහි දක්වා ඇත.

1 වන රූපසටහන: ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය සැපයීමේ සමස්ත අවදානම



සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යන අවදානම: මධ්‍යම

මෙම ඇගැයීම මගින්, ප්‍රධාන වශයෙන් ආදායම් උපදවන නීතිවිරෝධී ක්‍රියාකාරකම් (මූලික වැරදි) පදනම් කරගෙන, ශ්‍රී ලංකාවේ සමස්ත ජාතික මුදල් විශුද්ධිකරණ තර්ජනය **මධ්‍යම** මට්ටමක පවතින බව හඳුනාගෙන ඇත. ජාතික වශයෙන් මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ හැකියාව සහ ආංශික වශයෙන් මුදල් විශුද්ධිකරණ අවදානමට ලක් වීමේ හැකියාව සැලකිල්ලට ගනිමින්, සමස්ත ජාතික මුදල් විශුද්ධිකරණ අවදානමට ලක් වීමේ හැකියාව ද **මධ්‍යම** මට්ටමකින් තක්සේරු කර ඇත. ඒ අනුව, ජාතික මුදල් විශුද්ධිකරණ තර්ජනය සහ මුදල් විශුද්ධිකරණ අවදානමට ලක් වීමේ හැකියාවෙහි සංයෝගයක් වන, ශ්‍රී ලංකාවේ සමස්ත ජාතික මුදල් විශුද්ධිකරණ අවදානම **මධ්‍යම** ලෙස තක්සේරු කර ඇත. 2021/22 වසරේ සිදුකළ ජාතික අවදානම් තක්සේරුවට සාපේක්ෂව මෙම අවදානම් මට්ටම නොවෙනස් ව පවතී.

ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානමට ලක් වීමේ හැකියාව **මධ්‍යම** මට්ටමේ නොවෙනස් ව පැවතුන අතර, ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ තර්ජන මට්ටම **ඉහළ - මධ්‍යම** දක්වා වැඩිවීම හේතුවෙන්, ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ ජාතික අවදානම **ඉහළ - මධ්‍යම** ලෙස තක්සේරු කරන ලදී.

ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය ප්‍රවාහ සහ සැලකිය යුතු ගෝලීය ත්‍රස්ත අවදානම් සහිත පරිසරයක් තුළ පිහිටා තිබීම, මෙම අවදානම ඉහළ යෑමට හේතු වී ඇත.

ශ්‍රී ලංකාව, සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය සැපයීමේ අවදානම පළමු වරට ක්‍රමවත් ව තක්සේරු කළ බැවින්, 2024/25 ජාතික අවදානම් තක්සේරුව සුවිශේෂී වේ. සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය සැපයීමේ ඉහළ ගෝලීය තර්ජනයක් සහිත පරිසරයක් පැවතීම, ඒ සඳහා ශ්‍රී ලංකාවේ සීමිත නිරාවරණය සහ අවදානම් අවම කිරීමේ රාමු පැවතීම මත පදනම් ව, මෙම සමස්ත සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය සැපයීමේ අවදානම **මධ්‍යම** ලෙස තක්සේරු කර ඇත

නීති විරෝධී ක්‍රියාකාරකම් ආශ්‍රිත මුදල් විශුද්ධිකරණ තර්ජන මට්ටම් 1 වන වගුවෙහි දක්වා ඇත.

1 වන වගුව: නීති විරෝධී ක්‍රියාකාරකම් ආශ්‍රිත මුදල් විශුද්ධිකරණ තර්ජන මට්ටම

අංකය	නීති විරෝධී ක්‍රියාකාරකම්	තර්ජන මට්ටම
1	මත්ද්‍රව්‍ය ජාවාරම	ඉහළ
2	වංචා	ඉහළ මධ්‍යම
3	රේගු ආශ්‍රිත වැරදි, වෙළෙඳාම පදනම් කරගත් මුදල් විශුද්ධිකරණය	ඉහළ මධ්‍යම
4	අල්ලස් හා දූෂණ	මධ්‍යම
5	මිනිස් ජාවාරම	මධ්‍යම
6	මංකොල්ලකෑම්	මධ්‍යම
7	පාරිසරික සහ ස්වභාවික සම්පත් ආශ්‍රිත අපරාධ	මධ්‍යම
8	නීති විරෝධී, වාර්තා නොවූ සහ අවිධිමත් මසුන් සම්බන්ධ ක්‍රියාකාරකම්	මධ්‍යම
9	බදු අපරාධ	මධ්‍යම
10	සුරාබදු ආඥා පනත යටතේ උල්ලංඝනය කිරීම්	පහළ මධ්‍යම
11	මුදල් ව්‍යාජානුකරණය	පහළ

මූලාශ්‍රය: ජාතික අවදානම් ඇගැයීම - 2024/25

2021/ 22 කාල පරිච්ඡේදයේදී සිදු කළ ශ්‍රී ලංකාවේ දෙවන ජාතික අවදානම් ඇගැයීම සමග සැසඳීමේ දී, ආසන්නතම ජාතික අවදානම් ඇගැයීම මගින්, ඇතැම් නීති විරෝධී ක්‍රියාකාරකම් ආශ්‍රිත මුදල් විශුද්ධිකරණ තර්ජන මට්ටම් ඉහළ යාමක් ඉස්මතු කරයි.

වර්තමානයේ දී මත්ද්‍රව්‍ය ජාවාරම ඉහළ මුදල් විශුද්ධිකරණ අවදානමක් ඇති කරන අතර, මීට පෙර පැවති ජාතික අවදානම් ඇගැයීමට සාපේක්ෂ ව, වංචා, රේගු/වෙළෙඳාම පදනම් කරගත් මුදල් විශුද්ධිකරණය, බදු අපරාධ, මිනිස් ජාවාරම සහ නීති විරෝධී, වාර්තා නොවූ සහ අවිධිමත් මසුන් සම්බන්ධ ක්‍රියාකාරකම් යන සියල්ලේම මුදල් විශුද්ධිකරණ තර්ජනයන් ඉහළ මට්ටමක පවතින බව තක්සේරු වී ඇත.

තවද, පහත දක්වා ඇති පරිදි, මෙම ඇගැයීම මගින් එක් එක් අංශය සඳහා සමස්ත මුදල් විශුද්ධිකරණ අවදානම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම හඳුනා ගනු ලැබිණි.

2 වන වගුව: ආංශික මුදල් විශුද්ධිකරණ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම

අංශය	මුදල් විශුද්ධිකරණ අවදානම	ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම
බැංකු	ඉහළ මධ්‍යම	පහළ මධ්‍යම
මූල්‍ය සමාගම්	ඉහළ මධ්‍යම	පහළ මධ්‍යම
කැසිනෝ	ඉහළ මධ්‍යම	පහළ මධ්‍යම
දේපළ වෙළඳාම්	ඉහළ මධ්‍යම	පහළ මධ්‍යම
වටිනා ලෝහ, මැණික් ගල් සහ අඩ මැණික් ගල් අලෙවිකරුවන්	ඉහළ මධ්‍යම	පහළ මධ්‍යම
අවිධිමත් මුදල් හුවමාරු සේවා	ඉහළ මධ්‍යම	මධ්‍යම
කොටස් තැරැව්කරුවන්	මධ්‍යම	පහළ මධ්‍යම
ප්‍රාථමික අලෙවිකරුවන්	මධ්‍යම	පහළ මධ්‍යම
රක්ෂණ	මධ්‍යම	පහළ මධ්‍යම
භාර සහ සමාගම් සේවා සපයන්නන්	මධ්‍යම	පහළ මධ්‍යම
නීතිඥවරුන්	මධ්‍යම	පහළ මධ්‍යම
නොතාරිස්වරුන්	මධ්‍යම	පහළ මධ්‍යම
මුදල් හෝ වටිනාකම් හුවමාරු සේවා සපයන්නන්	මධ්‍යම	පහළ මධ්‍යම
ගණකාධිකාරිවරු	පහළ මධ්‍යම	පහළ මධ්‍යම
ඒකක භාර සහ ආයෝජන කළමනාකරුවන්	පහළ මධ්‍යම	පහළ මධ්‍යම
විද්‍යුත් මුදල් සේවා සපයන්නන්	පහළ මධ්‍යම	පහළ මධ්‍යම
සමුපකාර සමාගම්	පහළ මධ්‍යම	පහළ මධ්‍යම
සමෘද්ධි බැංකු	පහළ මධ්‍යම	පහළ මධ්‍යම
නියාමනය නොවන ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්	පහළ මධ්‍යම	පහළ මධ්‍යම
අවිධිමත් උකස් තැරැව්කරුවන්	පහළ මධ්‍යම	පහළ මධ්‍යම
අවිධිමත් මුදල් ණයට දෙන්නන්	පහළ මධ්‍යම	පහළ මධ්‍යම
පරිසීමිත වෙළෙඳුන්	පහළ මධ්‍යම	පහළ මධ්‍යම
බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්	පහළ මධ්‍යම	පහළ මධ්‍යම
කල්බදු සමාගම්	පහළ	පහළ මධ්‍යම

මූලාශ්‍රය: ජාතික අවදානම් ඇගැයීම - 2024/25

2024/25 ජාතික අවදානම් ඇගැයීමට අනුකූලව, ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීමේ සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීමේ රාමුවෙහි ශක්තිමත් නෛතික සහ ආයතනික පදනමක් පවතින අතර, දත්ත ඒකාබද්ධ කිරීම, තාක්ෂණය උපයෝගී කර ගැනීම, ඉහළ බලාත්මක කිරීමේ ප්‍රතිඵල සහ විශේෂයෙන් ම, ශ්‍රී ලංකාවේ ඉහළ ගිය ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම මෙන් ම පළමු වරට තක්සේරු කළ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය සැපයීමේ අවදානම ඇතුලුව නැගී එන අවදානම් කළමනාකරණය මගින් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම අවශ්‍ය වේ.

ජාතික අවදානම් ඇගැයීම් ක්‍රියාවලියට වැඩිදියුණු කිරීමක් ලෙස, ඇගැයීම් ශ්‍රේණිගත කිරීමේ අවබෝධය ජාතික වශයෙන් වැඩි දියුණු කිරීම සඳහා අවදානම, තර්ජනය සහ අවදානමට ලක්වීමේ හැකියාව යන්නෙහි පැහැදිලි නිර්වචන හඳුන්වා දෙන ලදී.

2.2 ප්‍රවේශය

2024/25 ජාතික අවදානම් ඇගැයීමෙහි සොයා ගැනීම් මත පදනම් ව, සංශෝධිත ජාතික අවදානම් පැතිකඩ මෙන් ම යාවත්කාලීන කරන ලද තර්ජන සහ අවදානමට ලක්වීමේ හැකියාව පිළිබිඹු කරමින්, මෙම ජාතික ප්‍රතිපත්තිය මගින් ඉදිරි වර්ෂ 5 ක කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීම පිළිබඳ රාමුව ශක්තිමත් කිරීම සඳහා ප්‍රවේශයක් සපයනු ලබයි. මෙම ජාතික අවදානම් ඇගැයීම මගින් වර්තමාන පද්ධතිය තුළ පවතින ප්‍රමුඛතා අංශ සහ පරතර හඳුනා ගනු ලැබුණු අතර, ආයතනික ධාරිතාව වැඩිදියුණු කරමින් සහ විකාසනය වන ජාත්‍යන්තර ප්‍රමිතීන්වලට අනුකූල වෙමින්, මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය පිළිබඳ අවදානම් කෙරෙහි අවධානය යොමු කරන උපාය මාර්ගික අරමුණු සහ ක්‍රියාමාර්ග සංවර්ධනය කිරීමට එම සොයා ගැනීම් මගින් මඟපෙන්වා දී ඇත. මෙම ඉදිරි දැක්ම පිළිබඳ ප්‍රවේශය මගින් ශ්‍රී ලංකාව මතු වන මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය පිළිබඳ අවදානම්වලට ශක්තිමත් ව සහ ප්‍රතිචාරශීලී ව ක්‍රියා කරමින්, තිරසර ආර්ථික වර්ධනය, මූල්‍ය සුපිළිපන්බව සහ මූල්‍ය අන්තර්ගත භාවය සඳහා සහාය ලබා දෙන බව තහවුරු කරයි.

2 වන රූප සටහන: ප්‍රවේශය



2.3. මූල්‍ය කාර්යසාධක බලකා ප්‍රමිතීන්වලට අනුකූල වීම සහ සඵලතා ඇගයීම

ශ්‍රී ලංකාව විසින් 2026 – 2030 කාල පරිච්ඡේදය තුළ මූල්‍ය කාර්යසාධක බලකා ප්‍රමිතීන්වලට සිදු කරන සංශෝධන ඇතුළු ව, ජාතික ප්‍රතිපත්තිමය අරමුණු සහ මූල්‍ය කාර්යසාධක බලකා නිර්දේශ 40 සහ සඵලතා ඇගයීමේ නිර්ණායක 11 අතර ක්‍රමානුකූල ලේඛනගත අනුරූපණයක් පවත්වා ගෙන යා යුතු ය. ජාතික සම්බන්ධීකරණ කමිටුව (NCC) විසින් 2026 වසර අවසානය වන විට,

i. සෑම මූල්‍ය කාර්යසාධක බලකා නිර්දේශයක්ම සහ සඵලතා ඇගයීමේ නිර්ණායකයක්ම, නිශ්චිත අරමුණු, ක්‍රියාමාර්ග සහ වගකිවයුතු අධිකාරීන් සමග අනුරූපණය කිරීම,
ii. අවශේෂ තාක්ෂණික සහ කාර්යක්ෂමතා පරතර හඳුනා ගැනීම සහ
iii. එම පරතර නිවැරදි කිරීම සඳහා නිශ්චිත සහ මැනිය හැකි දර්ශක සහ ඉලක්කගත දින නියම කිරීම තහවුරු කරනු ඇත.

2.4. මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියෙහි අරමුණු

ජාත්‍යන්තර යහපැවැත්මන් සහ පරිචයන් මත පදනම් වූ, සංශෝධිත ජාතික අවදානම් පැතිකඩ සහ 2024/25 ජාතික අවදානම් ඇගයීමෙහි සොයාගැනීම් සහ නිර්දේශ මත මෙන් ම, රටේ මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය හා සම්බන්ධ අවදානම් පිළිබඳ යාවත්කාලීන වූ අවබෝධය මත මෙම ජාතික ප්‍රතිපත්තිය, ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීමේ රාමුව ශක්තිමත් කිරීම වෙනුවෙන් ප්‍රධාන අරමුණු 15 ක් දක්වා ඇත. 2026 – 2030 කාල පරිච්ඡේදය තුළ දී මෙම අරමුණු මගින් ජාතික ප්‍රයත්නයන් මෙහෙය වනු ඇත.

3 වන රූප සටහන: මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියෙහි අරමුණු

1
ශ්‍රී ලංකාවේ දේශීය නීතිය, එහි පවතින දුවර්ලතා නිරන්තරයෙන් විශ්ලේෂණය කිරීම හරහා, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ/ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ/සමූලඝාතක අවි සංගුණනයට මුදල් සැපයීම වැළැක්වීමේ ජාත්‍යන්තර නිදෙර්ශවලට අඛණ්ඩව අනුකූල කර ගැනීම

2
මුදල් විශුද්ධිකරණයේ මූලික වැරදි/නීති විරෝධී ක්‍රියාකාරකම් කෙරෙහි අවධානය යොමු කරමින්, මුදල් විශුද්ධිකරණය/ත්‍රස්තවාදයට මුදල් සැපයීම / සමූලඝාතක අවිසංගුණනයට මුදල් සැපයීම සම්බන්ධ විමශර්න සහ නඩු පැවරීම්වල මෙන් ම වත්කම් රාජසන්තක කිරීම සඳහා වූ යාන්ත්‍රණයේ කායර්ක්ෂමතාව සහ ඵලදායීතාව ඉහළ නැංවීම.

3
ඉහළ අවදානම් සහිත අංශවල අධීක්ෂණ කටයුතු සඳහා වැඩි සම්පත් ප්‍රමාණයක් වෙන් කිරීම සහ අවදානම් ක්‍රමාංකනය ශක්තිමත් කිරීම මගින් ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම/සමූලඝාතක අවි සංගුණනයට මුදල් සැපයීම වැළැක්වීමේ අවදානම් පදනම් කරගත් අධීක්ෂණ රාමුව වැඩි දියුණු කිරීම.

4
සමස්ත දේශීය සහ ජාත්‍යන්තර සහයෝගීතාවය සහ සම්බන්ධීකරණය ප්‍රවධර්නය කිරීම සහ ශක්තිමත් කිරීම.

5
ඉහළ තජර්න පවතින අංශ කෙරෙහි අවධානය යොමු කරමින් ආයතනික ව ස්ථාපිත වැඩසටහන් හරහා ආයතනික ධාරිතාව පුළුල් කිරීම සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම/සමූලඝාතක අවි සංගුණනයට මුදල් සැපයීම වැළැක්වීම පිළිබඳ දැනුවත්භාවය ප්‍රවධර්නය කිරීම.

6
මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම/සමූලඝාතක අවි සංගුණනයට මුදල් සැපයීම වැළැක්වීම සම්බන්ධ යාවත්කාලීන කරන ලද සහ නිවැරදි දත්ත වෙත ප්‍රවේශ වීමේ හැකියාව තහවුරු කිරීම.

7
අවදානම්වලට අනුකූලව සකස් කරන ලද මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ක්‍රමවේද හරහා ශ්‍රී ලංකාවේ මූල්‍ය අන්තග්‍රර්හණය ප්‍රවධර්නය කිරීම.

8
අත්‍යාවශ්‍ය වත්කම් සේවා සපයන්නන් සඳහා වන විචක්ෂණශීලී නියාමන ආයතනයක් හඳුනා ගැනීම සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම/සමූලඝාතක අවි සංගුණනයට මුදල් සැපයීම වැළැක්වීමේ බැඳීම් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමුඛත්වය ලබා දීම.

9
ජාතික සයිබර් ආරක්ෂණ පද්ධතිය තවදුරටත් ශක්තිමත් කිරීම.

10
මූල්‍ය සමාගම් සහ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන්ගේ තත්කාලීන ගනුදෙනු අධීක්ෂණයට සහ අවදානම් ඇගැයීමට නවීන තාක්ෂණය අඛණ්ඩව භාවිත කිරීම.

11
සුරක්ෂිත ඩිජිටල් අනන්‍යතා පද්ධතියක් සහතික කිරීම සඳහා වන ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට ප්‍රමුඛතාව ලබාදීම.

12
සමූලඝාතක අවි සංගුණනයට මුදල් සැපයීම පිළිබඳ අවදානම් ඇගැයීමේ සොයාගැනීම්වලට අනුකූල වන පරිදි පාලන ක්‍රියාමාගර් ක්‍රියාත්මක කිරීම.

13
ඉහළ ගිය ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානමට අනුකූල වන පරිදි නෛතික රාමුව සහ ආයතනික ධාරිතාව පුළුල් කිරීම.

14
ඉහළ ගොස් ඇති, මත්ද්‍රව්‍ය ජාවාරම් සම්බන්ධ තජර්නවලට අනුකූල වන පරිදි ආයතනික ධාරිතාව පුළුල් කිරීම.

15
නෛතික පුද්ගලයන් සහ නෛතික වැඩපිළිවෙලයන්හි ප්‍රතිලාභී හිමිකාරීත්වය සම්බන්ධ විනිවිදභාවය වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාමාගර් ගැනීම.

1 වන අරමුණ: ශ්‍රී ලංකාවේ දේශීය නීතිය, එහි පවතින දුර්වලතා නිරන්තරයෙන් විශ්ලේෂණය කිරීම හරහා, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ/ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ/ සමූලඝාතක අවි සංගුණනයට මුදල් සැපයීම වැළැක්වීමේ ජාත්‍යන්තර නිර්දේශවලට අඛණ්ඩව අනුකූල කර ගැනීම.

ඉලක්ක:

i. මූල්‍ය කාර්යසාධක බලකා ප්‍රමිතීන්වලට අනුකූල ව මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීම හා සම්බන්ධ ව්‍යවස්ථාපිත වගවීම්, අධීක්ෂණ බලතල සහ දණ්ඩන නියම කිරීමේ බලධාරීත්වය පුළුල් කිරීම මගින් මූල්‍ය සහ මූල්‍ය නොවන අංශ සඳහා ජාතික නීතිමය රාමුව ශක්තිමත් කිරීම.

ii. නියාමනය නොවන සහ අවිධිමත් මූල්‍ය අංශය අධීක්ෂණය සහ බලාත්මක කිරීම ශක්තිමත් කිරීම සහ අවිධිමත් ආර්ථික කටයුතු ක්‍රමයෙන් විධිමත් කිරීම.

iii. මූල්‍ය කාර්යසාධක බලකා ප්‍රමිතීන් සමග අනුකූල වීම තහවුරු කිරීම සඳහා මූලික වැරදි/ නීති විරෝධී ක්‍රියාකාරකම්හි විෂය පථය අවශ්‍ය පරිදි පුළුල් කිරීම.

iv. ශක්තිමත් නීති, රෙගුලාසි සහ සුපරීක්ෂණ සහ අධීක්ෂණ යාන්ත්‍රණ හඳුන්වා දීම මගින් අතථ්‍ය වත්කම් සහ අතථ්‍ය වත්කම් සේවා සපයන්නන් සඳහා වන නියාමන රාමුව ශක්තිමත් කිරීම.

v. මූල්‍ය කාර්යසාධක බලකා ප්‍රමිතීන් සමග අනුකූල වීම සඳහා දැනට පවතින නීතිය අහෝසි කරමින්, ලාභ අරමුණු කර නොගත් සංවිධාන සඳහා නව නීති සම්පාදනය වේගවත් කිරීම.

vi. ලාභ අරමුණු කර නොගත් සංවිධාන[1] සඳහා අවදානම පදනම් කරගත් නියාමන සහ අධීක්ෂණ රාමුවක් හඳුන්වා දීම සහ ක්‍රියාත්මක කිරීම.

vii. නීත්‍යානුකූල, කාලීන සහ සඵලදායී දත්ත හුවමාරුව පහසු කිරීම සඳහා දේශීය ආදායම් පනතෙහි 100 වන වගන්තිය සංශෝධනය කරමින් අන්තර් නියෝජිත ආයතන සහයෝගීතාවය, සම්බන්ධීකරණය සහ තොරතුරු හුවමාරුව වැඩිදියුණු කිරීම.

viii. මූල්‍යමය දණ්ඩනවලට පමණක් සීමා නොවී, ක්‍රියාකාරකම් සීමා කිරීම සහ ජෝෂ්ඨ කළමනාකරණ වගවීම වැනි ඵලදායී, සමානුපාතික සහ වළක්වන බලපෑමක් ඇති පුළුල් පරාසයක සම්බාධක හඳුන්වා දීමෙන් බලාත්මක කිරීමේ තන්ත්‍රයේ ඵලදායීතාවය වැඩි දියුණු කිරීම.

ix. අධි අවදානම් සහිත නිෂ්පාදිත සඳහා වැඩිදියුණු කළ පාලන ක්‍රියාමාර්ග හඳුන්වා දීම, තේමාත්මක සමාලෝචන පුළුල් කිරීම සහ ඉලක්කගත නියාමන මාර්ගෝපදේශ නිකුත් කිරීම මගින් වැළැක්වීමේ පියවර තවදුරටත් ශක්තිමත් කිරීම.

[1] මූල්‍ය කාර්යසාධක බලකා නිර්වචනයට අනුව ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර කාණ්ඩයට අයත් වන ත්‍රස්තවාදයට මූල්‍ය සැපයීමේ වැඩි අවදානමකට ලක්විය හැකි උප සංවිධාන හඳුනාගෙන එම උප සංවිධාන සඳහා සමානුපාතික පියවර ගැනීම මගින්, 8 වන මූල්‍ය කාර්යසාධක බලකා නිර්දේශයට අනුකූල ව අවදානම් පදනම් කරගත් ප්‍රවේශයක් නව ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර නීති මගින් පැහැදිලිවම අනුගමනය කරනු ඇත. අධීක්ෂණ සහ ප්‍රජා සම්බන්ධතා රාමු, ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර අංශය සමග ව්‍යුහගත සම්බන්ධතාව, ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම් පිළිබඳ ඉලක්කගත මග පෙන්වීම සහ සමානුපාතික අවදානම්වලට අදාළ තොරතුරු රැස් කිරීම ඇතුළුව අපයෝජනය වැළැක්වීමේ දී නීත්‍යානුකූල පුණ්‍ය කටයුතු ආරක්ෂා කිරීම අවධාරණය කරනු ඇත.

2 වන අරමුණ: මුදල් විශුද්ධිකරණයේ මූලික වැරදි/නීති විරෝධි ක්‍රියාකාරකම් කෙරෙහි අවධානය යොමු කරමින්, මුදල් විශුද්ධිකරණය/ත්‍රස්තවාදයට මුදල් සැපයීම/සමූලඝාතක අවිසංගුණනයට මුදල් සැපයීම සම්බන්ධ විමර්ශන සහ නඩු පැවරීම්වල මෙන් ම වත්කම් රාජසන්තක කිරීම සඳහා වූ යාන්ත්‍රණයේ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව ඉහළ නැංවීම.

ඉලක්ක:

i. විශේෂිත ප්‍රවේශ සහ ධාරිතා වර්ධනය කිරීම මඟින් ත්‍රස්තවාදයට මුදල් සැපයීම හා සම්බන්ධ විමර්ශන සහ නඩු පැවරීම් තවදුරටත් ශක්තිමත් කිරීම.

ii. බදු අපරාධ මෙන් ම පාරිසරික සහ ස්වභාවික සම්පත් සම්බන්ධ අපරාධ ආශ්‍රිත මුදල් විශුද්ධිකරණ විමර්ශන සහ නඩු පැවරීම ශක්තිමත් කිරීම.

iii. අපරාධවලින් ජනනය වූ ආදායම් හඳුනා ගැනීම, සොයා බැලීම, අත් හිටුවීම, අත්පත් කර ගැනීම සහ රාජසන්තක කිරීම සඳහා වූ ක්‍රම වේද වැඩිදියුණු කිරීමට වත්කම් යථා තත්ත්වයට පත් කර ගැනීමේ සහ වත්කම් රාජසන්තක කිරීමේ යාන්ත්‍රණ වැඩි දියුණු කිරීම සහ තවදුරටත් ශක්තිමත් කිරීම.

iv. අදාළ සියලු අංශ හරහා සැක කටයුතු ගනුදෙනු වාර්තා කිරීම සහ විමර්ශනශීලී යාන්ත්‍රණ පුළුල් කිරීම සහ ශක්තිමත් කිරීම.

v. විමර්ශන සහ දඬුවම් නියම කිරීම් අවම මට්ටමක පැවතීම වෙනුවෙන් පිළියම් යෙදීම සඳහා නීතිය බලාත්මක කිරීමේ නියෝජිත ආයතන, නඩු පවරන්නන් සහ අධිකරණය අතර සම්බන්ධීකරණය සහ මෙහෙයුම් සඵලදායීත්වය තවදුරටත් ශක්තිමත් කිරීම.

vi. නව උපක්‍රම සහ ශිල්පීය ක්‍රමවේද හඳුන්වා දීම සහ ප්‍රමාණවත් සම්පත් සැපයීම, විශේෂිත උපකරණ සහ අඛණ්ඩ පුහුණුව ලබා දීම මඟින් විමර්ශන හැකියාව ශක්තිමත් කිරීම.

vii. නීති විරෝධී මූල්‍ය ප්‍රවාහ හඳුනා ගැනීම සහ වළක්වා ගැනීම සඳහා විදේශීය මුදල්, වටිනා ගල් සහ වටිනා ලෝහ දේශ සීමා අතර ගෙන යෑම සඳහා වන සම්බන්ධීකරණය කළ අධීක්ෂණ යාන්ත්‍රණ ශක්තිමත් කිරීම.

viii. විද්‍යුත් මුදල් පැවරුම් (**wire transfers**) සහ දේශ සීමා අතර මුදල් හුවමාරුවට[2] අදාළ ව අවදානම පදනම් කරගත් පාලන ක්‍රම, අධීක්ෂණ යාන්ත්‍රණ සහ සමානුපාතික සම්බාධක ශක්තිමත් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

---

[2] විධාන කරනු ලබන මූල්‍ය ආයතන, අතරමැදි මූල්‍ය ආයතන සහ ප්‍රතිලාභී මූල්‍ය ආයතනවලට ආරම්භක ගනුදෙනුකරුගේ සහ ප්‍රතිලාභියාගේ තොරතුරු වල සම්පූර්ණභාවය සහතික කිරීම, මගහැරුණු හෝ අසම්පූර්ණ දත්ත සහිත පැවරුම් හඳුනාගෙන කළමනාකරණය කිරීම සහ අවදානම් මත පදනම් වූ සුදුසු පාලනයන් සහ සම්බාධක යෙදීම සඳහා නියෝග කිරීම මඟින්, දේශසීමා අතර සිදුවන මූල්‍ය ප්‍රවාහවල ඇති අවදානම්වලට පිළියම් යෙදීම සඳහා, ශ්‍රී ලංකාව විද්‍යුත් මුදල් පැවරුම් (wire transfers) පිළිබඳ 16 වන මූල්‍ය කාර්යසාධක බලකා නිර්දේශය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කරනු ඇත. මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනයට හෝ ප්‍රකාශ නොකිරීමට සම්බන්ධ යැයි සැක කරන මුදල් සහ දරන්නාට ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර (bearer negotiable instruments) ප්‍රවාහනය සීමා කිරීමට සහ මූල්‍ය බුද්ධි ඒකකය සහ විදේශීය ප්‍රතිපාර්ශ්වයන් සමග තොරතුරු බෙදා ගැනීමට ඇති බලතල සමග රේගු සහ අනෙකුත් නිසි බලධාරීන් විසින් දේශසීමා හරහා මුදල් සහ දරන්නාට ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර හුවමාරුව සඳහා සඵලදායී ප්‍රකාශන හෝ හෙළිදරව් කිරීමේ පද්ධතියක් ක්‍රියාත්මක කරනු ඇත. ජාතික සම්බන්ධීකරණ කමිටුව විසින් ප්‍රකාශන, හසු කර ගැනීම්, ආශ්‍රිත සැක කටයුතු ගනුදෙනු වාර්තා සහ අදාළ පරීක්ෂණවල ප්‍රතිඵල පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්ෂික ව සම්පාදනය කර සමාලෝචනය කරනු ඇත.

3 වන අරමුණ: ඉහළ අවදානම් සහිත අංශවල අධීක්ෂණ කටයුතු සඳහා වැඩි සම්පත් ප්‍රමාණයක් වෙන් කිරීම සහ අවදානම් ක්‍රමාංකනය ශක්තිමත් කිරීම මගින් ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම/සමූලඝාතක අවි සංගුණනයට මුදල් සැපයීම වැළැක්වීමේ අවදානම් පදනම් කරගත් අධීක්ෂණ රාමුව වැඩි දියුණු කිරීම.

ඉලක්ක:

i. විචක්ෂණ අධීක්ෂකවරුන් විසින් මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීම හා සම්බන්ධ අධීක්ෂණය තවදුරටත් ශක්තිමත් කිරීම සහ විචක්ෂණ නියාමකයන් සහ මූල්‍ය බුද්ධි ඒකකය අතර අවදානම පදනම් කරගත් ඒකාබද්ධ අධීක්ෂණ යාන්ත්‍රණය **තවදුරටත්** ශක්තිමත් කිරීම**.**

ii. සුදුසු විචක්ෂණ නියාමන යාන්ත්‍රණයක් පිහිටු වීම මගින් මූර්ත දේපළ නියෝජිතයන් සඳහා නියාමන සහ අධීක්ෂණ රාමුව ශක්තිමත් කිරීම.

iii. මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීම පිළිබඳ අනුකූලතාවය ඇගයීමේ අවශ්‍යතා, ප්‍රතිලාභදායී හිමිකරුවන් ව්‍යාපාර වලට ඇතුළත් වීමේ නිර්ණායක සහ ඔවුන් නිසි සහ යෝග්‍ය තැනැත්තන් ද යන්න තක්සේරු කිරීම සඳහා ඒකාබද්ධ කිරීම මගින් වළක්වා ගැනීමේ පාලන ක්‍රම තවදුරටත් ශක්තිමත් කිරීම.

iv. සමානුපාතික අවදානම පදනම් කරගත් අධීක්ෂණය තහවුරු කිරීම සඳහා මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ සේවා සපයන්නන්ගේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීම පිළිබඳ ක්‍රියාමාර්ග අධීක්ෂණය ශක්තිමත් කිරීම සහ පුළුල් කිරීම.

v. අදියරෙන් අදියරට විධිමත්කරණය සිදු කිරීම සහ අවදානම පදනම් කරගත් අධීක්ෂණය ඔස්සේ ඉහළ අවදානම් සහිත නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් සහ අවිධිමත් අංශවල[3] නියාමන සහ අධීක්ෂණ රාමුව ශක්තිමත් කිරීම.

[3] 2024–25 ජාතික අවදානම් ඇගැයීමෙහි සොයාගැනීම් මත පදනම් ව, 2027 වන විට ශ්‍රී ලංකාව අදියර සහිත සැලැස්මක් අනුගමනය කර නියාමනය නොකළ කැසිනෝ, අවිධිමත් මුදල් හුවමාරු සේවා සපයන්නන්, අධි අවදානම් සහිත මූර්ත දේපළ වෙළෙඳාම් අතරමැදියන් සහ නියාමනය නොකළ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන වැනි ඉහළ අවදානම් සහිත නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් සහ අවිධිමත් මූල්‍ය අංශ, බලපත්‍ර ලබා දීම/ලියාපදිංචිය, නිසි සහ යෝග්‍යතා නිර්ණායක සහ අවදානම් මත පදනම් වූ අධීක්ෂණය ඔස්සේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීමේ රාමුව තුළට ගෙන එනු ඇත. අංශ සඳහා විශේෂිත වූ අධීක්ෂණ සැලසුම් මගින් "ඉහළ මධ්‍යම" මට්ටමේ මුදල් විශුද්ධිකරණ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානමක් ඇති අංශ කෙරෙහි අවධානය යොමු කරමින්, එතැන් සහ විතැන් පරීක්ෂණ, තේමාත්මක සමාලෝචන සහ බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ගවල අවම සංඛ්‍යාතය (වාර ගණන) සහ විෂය පථය නිර්වචනය කරනු ඇත. බලතල කාර්යක්ෂම, සමානුපාතික සහ නිරුත්සාහජනක ලෙස භාවිතා කිරීම පෙන්නුම් කිරීම සඳහා අධීක්ෂකවරුන් විසින් පරීක්ෂණ, උල්ලංඝනය කිරීම් සහ සම්බාධක පිළිබඳ සංඛ්‍යාලේඛන එකතු කර ප්‍රකාශයට පත් කරනු ඇත.

4 වන අරමුණ: සමස්ත දේශීය සහ ජාත්‍යන්තර සහයෝගීතාවය සහ සම්බන්ධීකරණය ප්‍රවර්ධනය කිරීම සහ ශක්තිමත් කිරීම.
ඉලක්ක: i. මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීම සඵලදායී ව අධීක්ෂණය කිරීම සඳහා නියාමකයන් අතර සම්බන්ධීකරණ යාන්ත්‍රණ වැඩිදුරටත් ශක්තිමත් කිරීම සහ අන්තර් නියෝජිත ආයතන සහයෝගීතාව වැඩි දියුණු කිරීම. ii. මූල්‍ය විමර්ශන සඳහා සහාය ලබා දීමට නීතිය බලාත්මක කිරීමේ නියෝජිත ආයතන අතර තොරතුරු හුවමාරු කර ගැනීමේ රාමු තවදුරටත් ශක්තිමත් කිරීම. iii. නීතිය බලාත්මක කිරීම සහ අපරාධමය අධිකරණ ක්‍රියාවලියෙහි නිරත වී සිටින සියලු ම පාර්ශ්වකරුවන් අතර සම්බන්ධීකරණ යාන්ත්‍රණ වැඩි දියුණු කිරීම සහ තවදුරටත් ශක්තිමත් කිරීම. iv. මූල්‍ය බුද්ධි ඒකකයේ චක්‍රලේඛ, මාර්ගෝපදේශ සහ රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරීත්වයන් (PPPs) ඔස්සේ සැක කටයුතු ගනුදෙනු රටා, අනතුරු ඇඟවීම් සහ සැක කටයුතු වාර්තාකරණ ප්‍රවණතා පිළිබඳ ආයතන අතර තොරතුරු හුවමාරු කර ගැනීම තවදුරටත් ශක්තිමත් කිරීම. v. අතථ්‍ය වත්කම් ආශ්‍රිත අවදානම් වලට මුහුණ දීම සඳහා ජාත්‍යන්තර සහයෝගීතාව සහ සම්බන්ධීකරණය ප්‍රවර්ධනය කිරීම සහ තවදුරටත් ශක්තිමත් කිරීම. vi. ඉලක්කගත මූල්‍ය සම්බාධක (TFS) ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ජාත්‍යන්තර සහයෝගීතාව ශක්තිමත් කිරීම. vii. ඉලක්කගත මූල්‍ය සම්බාධක ප්‍රමාදයකින්[4] තොරව සඵලදායී ව ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කිරීම සහ තහවුරු කිරීම. viii. නෛතික විධිවිධාන වැඩිදියුණු කිරීම, අන්තර් නියෝජිත ආයතන සම්බන්ධීකරණය ඉහළ නැංවීම සහ විදේශීය හවුල්කරුවන්[5] සමග කාලීන සහයෝගීතාව ඔස්සේ අන්‍යෝන්‍ය නෛතික සහාය සඳහා වන රාමුව සහ ජාත්‍යන්තර තොරතුරු හුවමාරු කර ගැනීම ශක්තිමත් කිරීම.

[4] ත්‍රස්තවාදය සහ සමූලඝාතක අවි සංගුණනයට සම්බන්ධ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ නම් කිරීම් දේශීය නීතියට පරිවර්තනය කර ප්‍රමාදයකින් තොරව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා ශ්‍රී ලංකාව සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටි අනුගමනය කර ක්‍රියාත්මක කරනු ඇත. සියලු ම මූල්‍ය ආයතන සහ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් විසින්, නම් කරන ලද පුද්ගලයින් සහ ආයතන වලට අයත් අරමුදල් සහ අනෙකුත් වත්කම් වහාම අවලංගු කිරීම සහ එවැනි පාර්ශ්වයන්ට මුදල් හෝ සේවා ලබාදීම තහනම් කිරීම සඳහා ලැයිස්තුගත කිරීම ඉවත් කිරීම සහ අවලංගු කිරීම ඉවත් කිරීම සඳහා වාර්තා කිරීම සහ ක්‍රියාවලි පිළිබඳ පැහැදිලි මග පෙන්වීමක් සහිත ව, නම් කරන ලද පුද්ගලයින් සහ ආයතන තත් කාලීනව හඳුනා ගැනීමට හැකියාව ඇති පරීක්ෂණ පද්ධති පවත්වාගෙන යාම අවශ්‍ය වේ. නිසි බලධාරීන් විසින් ඉලක්කගත මූල්‍ය සම්බාධක ක්‍රියාත්මක කිරීමේ කාලෝචිත භාවය, අවලංගු කිරීම්වල සංඛ්‍යා සහ වටිනාකම් සහ අදාළ අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ සංඛ්‍යාලේඛන පවත්වාගෙන යනු ඇත.

[5] පැමිණෙන සහ බැහැරට යන ඉල්ලීම් පිළිගැනීම, පැහැදිලි කිරීම සහ ඒවාට ස්වාධීන ප්‍රතිචාර දැක්වීම සඳහා කාලරාමු ඇතුළු ව, එවැනි ඉල්ලීම් හැසිරවීම සඳහා පැහැදිලි සේවා ප්‍රමිතීන් සහ නඩු කළමනාකරණ ක්‍රියාපටිපාටි අනුගමනය කිරීමෙන් ශ්‍රී ලංකාව සිය අන්‍යෝන්‍ය නීතිමය සහාය සහ උදර්පණය පිළිබඳ රාමුව තවදුරටත් ශක්තිමත් කරනු ඇත. මධ්‍යම අධිකාරිය සහ අදාළ නිසි බලධාරීන් විසින් අන්‍යෝන්‍ය නීතිමය සහාය සහ අනෙකුත් ජාත්‍යන්තර සහයෝගීතා ඉල්ලීම්වල සංඛ්‍යාව, වර්ගය, කාලෝචිතභාවය සහ ප්‍රතිඵල වාර්තා කර නිරීක්ෂණය කෙරෙනු ඇති අතර, බාධක හඳුනා ගැනීමට සහ සම්පත් වෙන් කිරීම පිළිබඳ තීරණ ගැනීමට මෙම දත්ත භාවිතා කෙරෙනු ඇත. ජාතික ප්‍රමුඛතා සහ ජාතික අවදානම් ඇගැයීමට අනුකූල වන අවස්ථාවන්හි දී නිරායාස තොරතුරු හුවමාරුව සහ ඒකාබද්ධ හෝ සමාන්තර පරීක්ෂණ භාවිතය ද ශ්‍රී ලංකාව විසින් ප්‍රවර්ධනය කරනු ඇත.

5 වන අරමුණ: ඉහළ තර්ජන පවතින අංශ කෙරෙහි අවධානය යොමු කරමින් ආයතනික ව ස්ථාපිත වැඩසටහන් හරහා ආයතනික ධාරිතාව පුළුල් කිරීම සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම/සමූලඝාතක අවි සංගුණනයට මුදල් සැපයීම වැළැක්වීම පිළිබඳ දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීම.

ඉලක්ක:

i. සියලු ම මූල්‍ය ආයතන, නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් සහ අදාළ පාර්ශ්ව සඳහා මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීම පිළිබඳ ක්‍රමික සහ ඉලක්කගත පුහුණු වැඩසටහන් පැවැත්වීම මගින් ආයතනික හැකියාව තවදුරටත් ශක්තිමත් කිරීම.

ii. පාරිසරික සහ ස්වභාවික සම්පත් ආශ්‍රිත **(ENV-NR)** අපරාධ, අතථ්‍ය වත්කම් සහ ක්‍රිප්ටෝ ආශ්‍රිත වංචා, බදු අපරාධ, ප්‍රතිලාභී අයිතීන්, ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම්, විශේෂයෙන් ම ලාභ අරමුණු කර නොගත් සංවිධාන සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යන අවදානමට අදාළ ව, ඒවා සම්බන්ධයෙන් මහජන සහ ආයතනික දැනුවත්භාවය වැඩි දියුණු කිරීම සහ තවදුරටත් ශක්තිමත් කිරීම.

iii. සියලු ම අදාළ රාජ්‍ය අංශ හවුල්කරුවන් අතර ආසන්නතම ජාතික අවදානම් ඇගයීමෙහි සොයා ගැනීම් සහ ප්‍රතිඵල පිළිබඳ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

iv. සියලු ම අදාළ පෞද්ගලික අංශ හවුල්කරුවන් අතර ආසන්නත ම ජාතික අවදානම් ඇගයීමෙහි සොයා ගැනීම් සහ ප්‍රතිඵල පිළිබඳ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

6 වන අරමුණ: මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම/ සමූලඝාතක අවි සංගුණනයට මුදල් සැපයීම වැළැක්වීම සම්බන්ධ යාවත්කාලීන කරන ලද සහ නිවැරදි දත්ත වෙත ප්‍රවේශ වීමේ හැකියාව තහවුරු කිරීම.

ඉලක්ක:

i. මූර්ත දේපළ නියෝජිතයන් සඳහා මධ්‍යගත දත්ත පද්ධති නිර්මාණය කිරීම මගින් දත්ත කළමනාකරණය ශක්තිමත් කිරීම.

ii. පාර්ශ්වකරුවන් අතර දත්ත හුවමාරු කර ගැනීමේ යාන්ත්‍රණයන් වැඩි දියුණු කිරීම.

iii. නෛතික පුද්ගලයන් සහ නෛතික වැඩ පිළිවෙල සඳහා වාර්තා සහ විද්‍යුත් ලියාපදිංචි කිරීමේ පද්ධති තවදුරටත් ශක්තිමත් කිරීම.

iv. රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයෙහි මධ්‍යගත දත්ත කළමනාකරණය සහ පුහුණුවලත් කාර්ය මණ්ඩල හැකියාව ශක්තිමත් කිරීම.

v. නිරවද්‍ය, ප්‍රමාණවත්, ප්‍රවේශ විය හැකි සහ යාවත්කාලීන කළ දත්ත පැවතීම තහවුරු කිරීම සඳහා සහ මධ්‍යගත ප්‍රතිලාභී අයිතීන් ලේඛනයක් වැඩි දියුණු කිරීම සඳහා ප්‍රතිලාභී අයිතීන් පිළිබඳ තොරතුරු පද්ධති තවදුරටත් ශක්තිමත් කිරීම.

vi.	මුදල් විශුද්ධිකරණය හා සම්බන්ධ අපරාධමය දණ්ඩනවල සමානුපාතිකත්වය සහ වැළැක්වීමේ බලපෑම පිළිබඳ ව නීතිය බලාත්මක කරන ආයතන, නඩු පවරන්නන් සහ විනිසුරුවන්ගෙන් තොරතුරු රැස් කිරීමට සහ විශ්ලේෂණය කිරීමට පුළුල් දත්ත සමුදායන් නිර්මාණය කිරීම සහ පවත්වාගෙන යෑම.
vii.	විශ්ලේෂණය සහ අවදානම් සොයා ගැනීම වැඩි දියුණු කිරීම සඳහා සැකකටයුතු ගනුදෙනු වාර්තා කිරීම සහ අනෙකුත් මුදල් විශුද්ධිකරණ දර්ශක දත්ත සමුදායන් තවදුරටත් ශක්තිමත් කිරීම.
viii.	පාරිභෝගිකයන් පිළිබඳ නිසි උද්යෝගයෙන් කටයුතු කිරීමේ අරමුණු සඳහා ලිපිනයන් සහ ආදායම ස්වාධීන ව සත්‍යාපනය කිරීමට සහාය ලබා දීම සඳහා උපයෝගීතාව සහ බදු සම්බන්ධ දත්ත සමුදා ඒකාබද්ධ කිරීම වැඩි දියුණු කිරීම.
ix.	පාරිභෝගිකයන් පිළිබඳ නිසි උද්යෝගයෙන් කටයුතු කිරීම සහ දැනට සිදු කරගෙන යන අධීක්ෂණ සඳහා සහාය ලබා දීමට ණය අරමුණුවලට ඔබ්බෙන්, ණය තොරතුරු කාර්යාංශය වැනි දැනට පවතින දත්ත සමුදා භාවිතය පුළුල් කිරීම සහ ශක්තිමත් කිරීම.
x.	දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි පවතින බදු අපරාධ සම්බන්ධ දත්ත සමුදා, නීතිපති දෙපාර්තමේන්තුවෙහි පවතින නඩු සම්බන්ධ දත්ත සමුදා, සහ තොග මුදල් සහ වටිනා පාෂාණ ජාවාරම සහ ඒ ආශ්‍රිත බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග නිරීක්ෂණය කිරීමට සම්බන්ධ දත්ත සමුදා යනාදී එම කාර්යයන් සඳහා ම වෙන් වූ දත්ත සමුදා තවදුරටත් ශක්තිමත් කිරීම.
xi.	ජාතික මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීම සම්බන්ධ පාලන තන්ත්‍රයෙහි[6] සඵලදායීත්වය තක්සේරු කිරීම සඳහා සවිස්තරාත්මක සංඛ්‍යාලේඛන සහ කාර්යසාධන අධීක්ෂණ රාමුව පිහිටුවීම සහ පවත්වා ගෙන යෑම.
xii.	ජාතික මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීමේ රාමුවෙහි[7] වාර්තාකරණ ගුණාත්මක භාවය, අනුකූලතා ප්‍රමිතීන් සහ සමස්ත සඵලදායීත්වය වැඩි දියුණු කිරීම සඳහා වාර්තාකරණ ආයතන වෙත ක්‍රමික, කාලීන සහ අවදානම පදනම් කරගත් ප්‍රතිචාර ලබා දීම සඳහා වන යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීම.

[6] හැකි සෑම විට ම මූලික වරද, අංශය සහ කලාපය අනුව වෙන් කර, සැක කටයුතු ගනුදෙනු වාර්තා සහ අනෙකුත් වාර්තා, මූල්‍ය විශ්ලේෂණ ප්‍රතිදාන, විමර්ශන, නඩු පැවරීම්, වරදකරුවන් බවට පත් කිරීම්, රාජසන්තක කිරීම්, අන්‍යෝන්‍ය නීති සහාය සහ ඉලක්කගත මූල්‍ය සම්බාධක ක්‍රියාත්මක කිරීම පිළිබඳ දත්ත ආවරණය වන පරිදි 2027 වන විට ජාතික මුදල් විශුද්ධිකරණ වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීමේ සංඛ්‍යාලේඛන රාමුවක් පිහිටු වනු ඇත. නිසි බලධාරීන් පොදු නිර්වචන සහ දත්ත ප්‍රමිතීන්ට එකඟ වනු ඇති අතර උපායමාර්ගික විශ්ලේෂණය, ප්‍රතිපත්ති යාවත්කාලීන කිරීම් සහ අන්‍යෝන්‍ය ඇගයීම් සහ පසු විපරම් සඳහා සූදානම් වීමට ජාතික සම්බන්ධීකරණ කමිටුව වෙත කාර්තුමය දත්ත ලබා දෙනු ඇත.

[7] වාර්තාකරණයේ ගුණාත්මකභාවය සහ ප්‍රයෝජනවත් බව ශක්තිමත් කිරීම සඳහා විමර්ශන සහ නඩු පැවරීම්වල දී සැක කටයුතු ගනුදෙනු වාර්තා භාවිතය පිළිබඳ අංශ සඳහා විශේෂිත වූ ගනුදෙනු රටා සම්බන්ධ වාර්තා, අනතුරු ඇඟවීම් සහ සමස්ත තොරතුරු ඇතුළු ව, මූල්‍ය බුද්ධි ඒකකය විසින් වාර්තාකරණ ආයතන වෙත අඛණ්ඩව ව්‍යුහගත ප්‍රතිචාර ලබා දෙනු ඇත. මෙම ප්‍රතිචාර දැක්වීම් අවම වශයෙන් වාර්ෂික ව සිදු කරනු ලබන අතර, වාර්තාකරණ හැසිරීම් පිළිබඳ සමීක්ෂණ සහ අධීක්ෂණ සමාලෝචන හරහා ඇගයීමට ලක් කෙරේ.

7 වන අරමුණ: අවදානම්වලට අනුකූලව සකස් කරන ලද මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ක්‍රමවේද හරහා ශ්‍රී ලංකාවේ මූල්‍ය අන්තර්ග්‍රහණය ප්‍රවර්ධනය කිරීම.

ඉලක්ක:

i. ජාතික මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ අරමුණු සමඟ අනුකූලව, අඩු අවදානම් සහිත ගනුදෙනුකරුවන් සඳහා සරල නිසි උද්යෝගීතා ක්‍රියාමාර්ග පිහිටු වීම මගින් මූල්‍ය අන්තර්ගතභාවය ශක්තිමත් කිරීම.

ii. ප්‍රවේශය විය හැකි, සුරක්ෂිත සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීමේ අවශ්‍යතාවලට අනුකූල වන තිරසර මූල්‍ය අන්තර්ගතභාවයට අදාළ නිෂ්පාදිත ප්‍රවර්ධනය කිරීම සහ තවදුරටත් ශක්තිමත් කිරීම.

iii. මූල්‍ය සේවා කරා ප්‍රවේශය පුළුල් කිරීම සඳහා ඩිජිටල් යටිතල පහසුකම් සහ සේවා සැපයීමේ මාර්ග තවදුරටත් ශක්තිමත් කිරීම.

iv. වගකීම් සහගත සහ දැනුවත් මූල්‍ය සේවා භාවිතයකට සහාය ලබා දීම සඳහා අඩු ආදායම්ලාභී සහ අඩු වරප්‍රසාදලත් කාණ්ඩ අතර මූල්‍ය සාක්ෂරතාව වැඩිදියුණු කිරීම.

v. ජාතික මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යන අවදානම් තක්සේරු කිරීමට සහ එම තක්සේරුවෙහි ප්‍රතිඵල නියාමකයන් සමග බෙදා ගැනීමට මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ නිෂ්පාදිත සහ සේවා සපයන්නන්ගේ හැකියාව ශක්තිමත් කිරීම.

vi. ජාතික මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීමේ අනුකූලතාව තහවුරු කිරීම සඳහා මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ නිෂ්පාදිත සහ සේවා සමාලෝචනය කිරීම මගින් නියාමන අධීක්ෂණය තවදුරටත් ශක්තිමත් කිරීම.

vii. මූල්‍ය සේවාවලට ප්‍රවේශ වීමට බාධා එල්ල නොකරන, සුදුසු, සමානුපාතික සහ අවදානම පදනම් කරගත් ක්‍රියාමාර්ග තහවුරු කිරීම සඳහා මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ඉලක්ක සමග ජාතික මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීමේ පාලන ක්‍රම තුලනය කිරීම සහ වැඩිදුරටත් ශක්තිමත් කිරීම.

8 වන අරමුණ: අතථ්‍ය වත්කම් සේවා සපයන්නන් සඳහා වන විචක්ෂණශීලී නියාමන ආයතනයක් හඳුනා ගැනීම සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම/ සමූලඝාතක අවි සංගුණනයට මුදල් සැපයීම වැළැක්වීමේ බැඳීම් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමුඛත්වය ලබා දීම.

ඉලක්ක:

i. අතථ්‍ය වත්කම්/ අතථ්‍ය වත්කම් සේවා සපයන්නන් නියාමනය පිළිබඳ ව ජාතික ප්‍රතිපත්තියක් හඳුන්වා දීම.

ii. විචක්ෂණ නියාමකයා ලෙස නිසි බලධාරියෙකු විධිමත් ලෙස පත් කිරීම මගින් සහ බලපත්‍ර ලබා දීම, ලියාපදිංචිය, අධීක්ෂණය සහ බලාත්මක කිරීමේ අවශ්‍යතා පුළුල් ලෙස පිහිටු වීම මගින් අතථ්‍ය වත්කම් සේවා සපයන්නන්ගේ නියාමන රාමුව සහ අධීක්ෂණය ශක්තිමත් කිරීම.

iii. අතථ්‍ය වත්කම් සේවා සපයන්නන්ගේ ක්‍රියාකාරකම්හි මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යන අවදානම් තක්සේරු කිරීම සහ සමානුපාතික අධීක්ෂණ ක්‍රියාමාර්ග සහතික කිරීම සඳහා අධීක්ෂණ ක්‍රමවේදය වැඩිදියුණු කිරීම සහ තවදුරටත් ශක්තිමත් කිරීම.

iv. අතථ්‍ය වත්කම් සේවා සපයන්නන් සඳහා එක් එක් අංශයට විශේෂිත වූ මාර්ගෝපදේශ, වාර්තාකරණ අවශ්‍යතා සහ අපේක්ෂාවන් සංවර්ධනය කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම මගින් අනුකූලතාව සහ විනිවිදභාවය ශක්තිමත් කිරීම.

v. අතථ්‍ය වත්කම් සේවා සපයන්නන්ගේ කටයුතු සඵලදායී ව අධීක්ෂණය කිරීම සඳහා විචක්ෂණ නියාමක, මූල්‍ය බුද්ධි ඒකකය, නීතිය බලාත්මක කිරීමේ සහ අනෙකුත් අදාළ නියෝජිත ආයතන අතර සම්බන්ධීකරණ යාන්ත්‍රණයන් තවදුරටත් ශක්තිමත් කිරීම.

vi. මතු වන අතථ්‍ය වත්කම් අවදානම්, අනතුරු ඇඟවීම් සහ අනුකූලතා වගකීම් පිළිබඳව අධීක්ෂකවරුන් සහ අතථ්‍ය වත්කම් සේවා සපයන්නන් සඳහා වන හැකියා වර්ධනය කිරීමේ වැඩසටහන් ශක්තිමත් කිරීම.

vii. ශ්‍රී ලංකාව තුළ සේවා සපයන විදේශීය අතථ්‍ය වත්කම් සේවා සපයන්නන් අධීක්ෂණය කිරීමේ සහ ඒ සම්බන්ධ අවදානම් අවම කිරීමේ ක්‍රියාපටිපාටි තවදුරටත් ශක්තිමත් කිරීම.

9 වන අරමුණ: ජාතික සයිබර් ආරක්ෂණ පද්ධතිය තවදුරටත් ශක්තිමත් කිරීම.

ඉලක්ක:

i. සයිබර් ආශ්‍රිත මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනයෙහි අවදානම්, එම අවදානම් වලට පද්ධතින් නැඹුරු වීමේ හැකියාව සහ වාර්තාකරණ ආයතන හරහා ඩිජිටල් වංචාවන්ට නිරාවරණය වීම පිළිබඳ වරින්වර තක්සේරු කිරීම මගින් සයිබර් ආරක්ෂාව සම්බන්ධ අවදානම් කළමනාකරණය තවදුරටත් ශක්තිමත් කිරීම.

ii. සැක සහිත සයිබර් ක්‍රියාකාරකම්, ඩිජිටල් ගනුදෙනු විෂමතා සහ වංචා උත්සාහයන් අනාවරණය කර ගැනීම සඳහා ශක්තිමත් පද්ධති යෙදවීමට නියෝග කිරීම මගින් අධීක්ෂණ හැකියා ශක්තිමත් කිරීම.

iii. සයිබර් සිදුවීම්, උල්ලංඝනය කිරීම් සහ ඩිජිටල් වංචා උත්සාහයන් මූල්‍ය බුද්ධි ඒකකය සහ අදාළ බලධාරීන් වෙත වාර්තා කිරීම සඳහා අනිවාර්ය කාලරාමු සහ ක්‍රියාපටිපාටි හඳුන්වා දීම මඟින් සිද්ධීන් වාර්තාකරණය තවදුරටත් ශක්තිමත් කිරීම.

iv. සයිබර් කේන්ද්‍ර කරගත් අධීක්ෂණ සහ සයිබර් ආරක්ෂණ බැඳියාවන්ට අනුකූල වීම බලාත්මක කිරීම සඳහා නියාමකයින්ට හැකියාව ලබා දීමෙන් නියාමන අධීක්ෂණය වැඩිදියුණු කිරීම සහ තවදුරටත් ශක්තිමත් කිරීම.

v. නියාමකයින්, මූල්‍ය බුද්ධි ඒකකය, වාර්තාකරණ ආයතන සහ නීතිය බලාත්මක කරන ආයතන අතර සයිබර් තර්ජන හා සම්බන්ධ බුද්ධි තොරතුරු, අනතුරු ඇඟවීම් සහ සැක කටයුතු ගනුදෙනු රටා හුවමාරු කිරීම සඳහා යාන්ත්‍රණ ස්ථාපිත කිරීම මගින් ජාතික සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම.

vi. නව සයිබර් තර්ජන, ඩිජිටල් නාලිකාවල මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යන අවදානම් සහ සයිබර් ආරක්ෂණය හා සම්බන්ධ මනා පරිචයන් පිළිබඳව වාර්තා කරන ආයතන සඳහා අඛණ්ඩ පුහුණුවක් ලබාදීමෙන් හැකියා වර්ධනය තවදුරටත් ශක්තිමත් කිරීම.

vii. නියමිත සයිබර් ආරක්ෂණ බැඳීම්වලට අනුකූල නොවීම සඳහා සමානුපාතික දණ්ඩන හඳුන්වා දීමෙන් බලාත්මක කිරීමේ රාමුව වැඩිදියුණු කිරීම සහ තවදුරටත් ශක්තිමත් කිරීම.

10 වන අරමුණ: මූල්‍ය සමාගම් සහ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන්ගේ තත්කාලීන ගනුදෙනු අධීක්ෂණයට සහ අවදානම් ඇගැයීමට නවීන තාක්ෂණය අඛණ්ඩව භාවිත කිරීම.

ඉලක්ක:

i. උසස් තාක්ෂණික ගනුදෙනු අධීක්ෂණ පද්ධති සඳහා ආයෝජනය ප්‍රවර්ධනය කිරීම මඟින් සැකසහිත ගනුදෙනු හඳුනාගැනීම ශක්තිමත් කිරීම.

ii. කෘත්‍රිම බුද්ධිය (AI), යාන්ත්‍රික ඉගෙනීම සහ රීති මත පදනම් වූ තත් කාලීන ගනුදෙනු අධීක්ෂණ පද්ධති ක්‍රියාත්මක කිරීම ප්‍රවර්ධනය මගින් වාර්තාකරණ ආයතනවල හැකියාවන් තවදුරටත් ශක්තිමත් කිරීම.

iii. දත්තවල ගුණාත්මකභාවය, පද්ධති නිරවද්‍යතාව, සාමාන්‍ය ගනුදෙනු සැකසහිත ලෙස වරදවා හඳුනාගැනීම කළමනාකරණය සහ විගණන හැකියාව ඇතුළු ව ස්වයංක්‍රීය අධීක්ෂණ පද්ධති සඳහා ජාතික ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම සහ ශක්තිමත් කිරීම.

iv. ගනුදෙනු අධීක්ෂණයට අදාළව මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යන අවදානම්, පද්ධති දුර්වලතා සහ දත්ත පාලන අභියෝග පිළිබඳ කාලානුරූපී තක්සේරු කිරීම් සිදු කිරීම වාර්තාකරණ ආයතනවලට නියම කිරීම මගින් තාක්ෂණික අවදානම් කළමනාකරණය ශක්තිමත් කිරීම.

v. වාර්තාකරණ ආයතනවල තාක්ෂණයේ ප්‍රමාණවත් බව සහ සඵලදායීත්වය ඇගැයීම සඳහා නියාමන නිලධාරීන්ට අවශ්‍ය මෙවලම් සහ ශිල්පීය දැනුම ලබා දීම මඟින් නියාමන හැකියාව තවදුරටත් ශක්තිමත් කිරීම.

vi. මූල්‍ය බුද්ධි ඒකකය, නියාමකයින් සහ වාර්තාකරණ ආයතන අතර අවදානම් දර්ශක, සැක සහිත ගනුදෙනු රටා, අනතුරු ඇඟවීම් සහ සයිබර් ආශ්‍රිත බුද්ධි තොරතුරු ආසන්න වශයෙන් තත් කාලීනව හුවමාරු කර ගැනීම සඳහා ආරක්ෂිත ක්‍රම වේද පිහිටුවීමෙන් තොරතුරු හුවමාරු කිරීම ශක්තිමත් කිරීම.

vii. නියාමකයින් විසින් මෙහෙයවනු ලබන අංශ සඳහා විශේෂිත හෝ අංශ අතර පරීක්ෂණ අවකාශ (sandboxes) හරහා නියමු පරීක්ෂණ ප්‍රවර්ධනය කිරීම මගින් මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීමේ තාක්ෂණ නවෝත්පාදනයන් තවදුරටත් ශක්තිමත් කිරීම.

viii. නව තාක්ෂණය, ඩිජිටල් අවදානම්, දත්ත විශ්ලේෂණය සහ තත් කාලීන අධීක්ෂණ ක්‍රමවේද පිළිබඳ ව වාර්තාකරණ ආයතන සහ නියාමකයන් සඳහා පුහුණුව ලබා දීම මගින් හැකියා වර්ධනය වැඩි දියුණු කිරීම සහ තවදුරටත් ශක්තිමත් කිරීම.

ix. ස්වයංක්‍රීය ගනුදෙනු අධීක්ෂණය හා සම්බන්ධ තීරණ සඳහා පද්ධති ලොග් වාර්තා, තීරණ ක්‍රියාවලි සහ සත්‍යාපන වාර්තා පවත්වා ගැනීමට වාර්තාකරණ ආයතන වෙත නියම කිරීම මගින් විනිවිදභාවය සහ වගවීම ශක්තිමත් කිරීම.

x. මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීම ආශ්‍රිත ව තෙවන පාර්ශ්වීය තාක්ෂණ සැපයුම්කරුවන් විසින් සිදු කරන සහාය කාර්යයන් අඛණ්ඩව අධීක්ෂණය කිරීමට සහ ඔවුන් පිළිබඳව නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමට මාර්ගෝපදේශ හඳුන්වා දීම මඟින් ඔවුන්ගේ අධීක්ෂණය තවදුරටත් ශක්තිමත් කිරීම.

11 වන අරමුණ: සුරක්ෂිත ඩිජිටල් අනන්‍යතා පද්ධතියක් සහතික කිරීම සඳහා වන ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට ප්‍රමුඛතාව ලබාදීම.

ඉලක්ක:

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව (DRP) හරහා ඩිජිටල් හඳුනාගැනීමේ ලේඛන නිකුත් කිරීම සහ අක්‍රියව පවතින වේලාවන් අඩු කරමින් මාර්ගගත සත්‍යාපන පද්ධතිය වැඩිදියුණු කිරීම මඟින් ඩිජිටල් අනන්‍යතා පද්ධතියේ විශ්වසනීයත්වය සහ පිවිසීමේ හැකියාව ශක්තිමත් කිරීම.

ii. දෙවරක් සටහන් වීමේ වරද අවම කිරීමට, නිරවද්‍යතාව වැඩි දියුණු කිරීමට සහ සත්‍යාපනය විධිමත් කිරීමට, ගනුදෙනුකරු හඳුනා ගැනීමේ හවුල්කාරීත්ව යාන්ත්‍රණයක් හඳුන්වා දීම මඟින්, ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් කටයුතු කිරීමේ ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීම.

12 වන අරමුණ: සමූලඝාතක අවි සංගුණනයට මුදල් සැපයීම පිළිබඳ අවදානම් ඇගැයීමේ සොයාගැනීම්වලට අනුකූල වන පරිදි පාලන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම.

ඉලක්ක:

i. හඳුනාගත් සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යන අවදානම් සමානුපාතිකව කළමනාකරණය සඳහා ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ යාවත්කාලීන කිරීමෙන් නියාමන ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම.

ii. සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය පිළිබඳ තර්ජන ඵලදායී ලෙස අවම කිරීම සහතික කිරීම සඳහා ඉහළ අවදානම් සහිත ගනුදෙනුකරුවන් සහ ගනුදෙනු සඳහා වැඩිදියුණු කළ පිරික්සුම් ක්‍රියාවලින් ක්‍රියාත්මක කිරීම.

iii. සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යන කටයුතු හඳුනා ගැනීමට සහ වළක්වා ගැනීමට මූල්‍ය ව්‍යාපාර සහ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන්හි වාර්තාකරණ සහ අධීක්ෂණ යාන්ත්‍රණ වැඩි දියුණු කිරීම.

iv. සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය පාලනය කිරීමේ ක්‍රියාමාර්ග සඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීමට රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ පාර්ශ්වකරුවන් සඳහා ඉලක්කගත දැනුවත් කිරීමේ සහ පුහුණු වැඩසටහන් සංවර්ධනය කිරීම.

13 වන අරමුණ: ඉහළ ගිය ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානමට අනුකූල වන පරිදි නෛතික රාමුව සහ ආයතනික ධාරිතාව පුළුල් කිරීම.

ඉලක්ක:

i. ත්‍රස්තවාදයට මුදල් සැපයීම සඵලදායී ව මැඩ පැවැත්වීම සඳහා දැනට පවතින නීති සංශෝධනය කිරීම සහ නව විධිවිධාන හඳුන්වා දීම මගින් නෛතික රාමුව ශක්තිමත් කිරීම.

ii. ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ විමර්ශන සඳහා විශේෂිත පුහුණුව, තාක්ෂණික සහාය සහ සම්පත් වෙන් කිරීම ඔස්සේ නියාමන සහ නීතිය බලාත්මක කිරීමේ නියෝජිත ආයතනවල ආයතනික හැකියාව වැඩි දියුණු කිරීම.

iii. ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ කටයුතු කාලෝචිත ව හඳුනා ගැනීමට සහ වැළැක්වීමට සහාය ලබා දීම සඳහා අන්තර් නියෝජිත ආයතන සම්බන්ධීකරණය සහ තොරතුරු හුවමාරු කර ගැනීමේ යාන්ත්‍රණයන් වැඩිදියුණු කිරීම.

iv. ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම් හඳුනා ගැනීම, වාර්තා කිරීම සහ අවම කිරීම සඳහා සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීමට රාජ්‍ය - පෞද්ගලික අංශ සම්බන්ධතා වැඩසටහන් සංවර්ධනය කිරීම.

14 වන අරමුණ: ඉහළ ගොස් ඇති, මත්ද්‍රව්‍ය ජාවාරම් සම්බන්ධ තර්ජනවලට අනුකූල වන පරිදි ආයතනික ධාරිතාව පුළුල් කිරීම.

ඉලක්ක:

i. පුහුණු වැඩසටහන්, නවීන/දියුණු විමර්ශන මෙවලම් භාවිතය සහ මත්ද්‍රව්‍ය ජාවාරම ඉලක්ක කරගත් බුද්ධි අංශ මෙහෙයුම් හරහා නීතිය බලාත්මක කරන ආයතනවල මෙහෙයුම් හැකියාව ශක්තිමත් කිරීම.

ii. නීති විරෝධී මත්ද්‍රව්‍ය ආශ්‍රිත මූල්‍ය ප්‍රවාහ හඳුනා ගැනීම සහ වැළැක්වීම සඳහා නියාමන අධීක්ෂණය සහ අධීක්ෂණ පද්ධති වැඩිදියුණු කිරීම.

iii. දේශසීමා හරහා සිදුවන මත්ද්‍රව්‍ය ජාවාරම සඳහා කාර්යක්ෂමව ප්‍රතිචාර දැක්වීමට ජාතික සහ ජාත්‍යන්තර ආයතන අතර සම්බන්ධීකරණය සහ සහයෝගීතාවය වැඩිදියුණු කිරීම.

iv. මත්ද්‍රව්‍ය ආශ්‍රිත මුදල් විශුද්ධිකරණ අවදානම් හඳුනාගෙන ඒවාට ප්‍රතිචාර දැක්වීම සඳහා රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ පාර්ශ්වකරුවන් සඳහා හැකියා වර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම.

v. මත්ද්‍රව්‍ය ජාවාරම් ජාල හඳුනාගෙන ඒවා බිඳ දැමීමට ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහ ශ්‍රී ලංකා වෙරළාරක්ෂක බලකායේ හැකියාවන් වැඩි කිරීම.

15 වන අරමුණ: නෛතික පුද්ගලයන් සහ නෛතික වැඩපිළිවෙලයන්හි ප්‍රතිලාභී හිමිකාරීත්වය සම්බන්ධ විනිවිදභාවය වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම.

ඉලක්ක:

i. නෛතික පුද්ගලයන් සහ නෛතික වැඩපිළිවෙල සඳහා ප්‍රතිලාභී හිමිකාරීත්ව ලියාපදිංචිය ක්‍රියාත්මක කිරීම සහ නිසි බලධාරීන්ට සහ වාර්තාකරණ ආයතනවලට ප්‍රවේශ විය හැකි මධ්‍යගත ප්‍රතිලාභදායී හිමිකාරීත්ව ලේඛනයක් පිහිටු වීම.

ii. නිසි බලධාරීන්ට[8] ප්‍රතිලාභී හිමිකාරීත්ව තොරතුරු කාලෝචිත ලෙස ලබා ගැනීම, එම තොරතුරු වල නිරවද්‍යතාවය සහ එම තොරතුරු වලට පිවිසීමේ හැකියාව සහතික කිරීම සඳහා පුළුල් නෛතික, නියාමන සහ ආයතනික යාන්ත්‍රණ පිහිටු වීම මගින් ප්‍රතිලාභදායී හිමිකාරීත්ව විනිවිදභාවය පිළිබඳ රාමුව ශක්තිමත් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

[8] නෛතික පුද්ගලයන් සහ නෛතික වැඩපිළිවෙලයන්හි ප්‍රතිලාභී අයිතීන් පිළිබඳ සංශෝධිත මූල්‍ය කාර්යසාධක බලකා අවශ්‍යතා සම්පූර්ණයෙන් ම සපුරාලීම සඳහා, ශ්‍රී ලංකාව 2027 වන විට ප්‍රතිලාභී අයිතීන් තොරතුරු ප්‍රමාණවත්, නිවැරදි සහ යාවත්කාලීන බවත් නිසි බලධාරීන්ට කාලෝචිත ආකාරයකින් ලබා ගත හැකි බවත් සහතික කිරීම සඳහා අවදානම් සංවේදී රාමුවක් පිහිටුවනු ඇත. මේ සඳහා, (i) සමාගම්, හවුල් ව්‍යාපාර සහ නෛතික වැඩපිලිවෙල සඳහා ප්‍රතිලාභී හිමිකාරීත්ව තොරතුරු ලබා ගැනීම සහ පවත්වාගෙන යෑම පිළිබඳ පැහැදිලි නීතිමය බැඳියා; (ii) සමානුපාතික සත්‍යාපන යාන්ත්‍රණ (බඳු, උපයෝගිතා සහ ණය දත්ත සමුදායන්ට එරෙහිව හරස් පරීක්ෂා සිදු කිරීම් ඇතුළු ව); (iii) අනුකූල නොවීම හෝ ව්‍යාජ තොරතුරු සැපයීම සඳහා ඵලදායී, සමානුපාතික සහ නිරුත්සාහජනක සම්බාධක; සහ (iv) දත්ත ආරක්ෂණ අවශ්‍යතාවලට අනුකූලව නිසි බලධාරීන්, මූල්‍ය බුද්ධි ඒකකයට සහ වාර්තාකරණ ආයතන සඳහා ආරක්ෂිත, ස්ථර සහිත ප්‍රවේශයක් යනාදිය ඇතුළත් වේ. සමාගම් රෙජිස්ට්‍රාර් සහ අනෙකුත් අදාළ රෙජිස්ට්‍රාර්වරුන් විසින් ප්‍රතිලාභී හිමිකාරීත්ව දත්ත පිළිබඳ ගුණාත්මක පාලන පවත්වා ගෙන යා යුතු අතර අධීක්ෂණය, විමර්ශන, නඩු පැවරීම් සහ ජාත්‍යන්තර සහයෝගීතාවයේ දී ප්‍රතිලාභී හිමිකාරීත්ව තොරතුරු භාවිතය පිළිබඳ වාර්ෂික සංඛ්‍යාලේඛන ප්‍රකාශයට පත් කළ යුතු ය.

2.5. මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මෙහෙය වීමේ මූලධර්ම

පහත දක්වා ඇති උපාය මාර්ගික මූලධර්ම කාණ්ඩය මගින් මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ එහි ක්‍රියාකාරී සැලැස්ම සඵලදායී ව ක්‍රියාත්මක කිරීම මෙහෙයවනු ලැබේ. මෙම මූලධර්ම මගින් විකාසය වන මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යන අවදානම් සඳහා පිළියම් යෙදීමට අවදානම පදනම් කරගත් ප්‍රවේශයක්, ශක්තිමත් නෛතික සහ ආයතනික ව්‍යුහයන්, පාර්ශ්වකරුවන් අතර වැඩිදියුණු කළ සම්බන්ධීකරණය, තාක්ෂණය මගින් මෙහෙයවනු ලබන විසඳුම් සහ අඛණ්ඩ ධාරිතා ගොඩනැඟීම අවධාරණය කෙරේ.

i. අඛණ්ඩ නෛතික අනුකූලතාව සහ නවීකරණය
ii. විමර්ශනාත්මක, නඩු පැවරීමේ සහ වත්කම් අයකර ගැනීමේ හැකියා ශක්තිමත් කිරීම.
iii. අවදානම් පදනම් කරගත් සහ සඵලදායී අධීක්ෂණය
iv. වැඩි දියුණු කළ දේශීය සහ ජාත්‍යන්තර සහයෝගීතාව
v. ආයතනික ධාරිතාව සහ දැනුවත්භාවය ගොඩනැඟීම
vi. තත් කාලීන, ඒකාබද්ධ සහ නිරවද්‍ය දත්ත කළමනාකරණය
vii. අවදානම් අවම කිරීම සමග මූල්‍ය අන්තර්ගතභාවය
viii. නැඟී එන අංශවල නියාමන අධීක්ෂණය
ix. සයිබර් ආරක්ෂාව සහ ඩිජිටල්මය ඔරොත්තු දීමේ හැකියාව
x. තාක්ෂණයෙන් මෙහෙයවනු ලබන මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීමේ හැකියා
xi. සුරක්ෂිත සහ විශ්වසනීය ඩිජිටල්මය හඳුනා ගැනීමේ යටිතල පහසුකම්
xii. සමානුපාතික සහ අවදානම් ප්‍රතිචාරක පාලන ක්‍රියාමාර්ග
xiii. ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහි ව නෛතික සහ ආයතනික වැඩි දියුණු කිරීම.
xiv. මත්ද්‍රව්‍ය ආශ්‍රිත මුදල් විශුද්ධිකරණ තර්ජනයට එරෙහිව ක්‍රියා කිරීම සඳහා ඉලක්කගත ආයතනික ශක්තිමත් කිරීම.
xv. මුදල් විශුද්ධිකරණය/ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අරමුණු සඳහා නෛතික පුද්ගලයන් සහ නෛතික වැඩපිළිවෙලයන් අවභාවිතය වළක්වා ගැනීමට එහි හිමිකාරීත්ව ව්‍යුහයන්ගේ විනිවිදභාවය ශක්තිමත් කිරීම.

3. නෛතික රාමුව

ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීම පිළිබඳ පාලන අධිකාරිය ප්‍රධාන වශයෙන් පහත දක්වා ඇති නීති වලින් සමන්විත වේ:

i. සංශෝධිත පරිදි, 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩ පැවැත්වීමේ සම්මුති පනත
ii. සංශෝධිත පරිදි, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත
iii. 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත

4. ජාතික සම්බන්ධීකරණය

මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීම පිළිබඳ පරතර සඳහා පිළියම් යෙදීමට ස්ථර දෙකකින් යුත් සම්බන්ධීකරණ ව්‍යුහයක් ශ්‍රී ලංකාව විසින් පිහිටුවා ඇත.

i. ජාතික සම්බන්ධීකරණ කමිටුව (NCC): ඉහළතම මට්ටමින් උපාය මාර්ගික අධීක්ෂණය සපයයි.
ii. මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීමේ කාර්යසාධන බලකාය: අධිකරණ නායකත්වය සමග මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමට මඟපෙන්වනු ලබයි.

5. නියාමන රාමුව

නියාමන ආයතන ගණනාවක් විසින් ශ්‍රී ලංකාවේ මූල්‍ය සහ මූල්‍ය නොවන අංශ අධීක්ෂණය සහ නියාමනය සිදු කරනු ලබයි.

අ. මූල්‍ය අංශ නියාමකයන්

I. ශ්‍රී ලංකා මහ බැංකුව
   i. බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව
   ii. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව

iii. විදේශ විනිමය දෙපාර්තමේන්තුව
iv. ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව
v. මූල්‍ය බුද්ධි ඒකකය

II. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව
III. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව
IV. සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

ආ. නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් (DNFBP) හි බලධාරීන් සහ ස්වයං නියාමන ආයතන

I. ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
II. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය
III. ස්වයං නියාමන ආයතන (ශ්‍රී ලංකා නීතිඥ සංගමය, ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය)
IV. සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
V. සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය
VI. සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය

6. නීතිය බලාත්මක කිරීමේ රාමුව

පහත දක්වා ඇති නියෝජිත ආයතනවලට නීතිය සහ සාමය බලාත්මක කිරීමේ අධිකාරිය ඇත:

I. ශ්‍රී ලංකා පොලිසිය
II. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
III. ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
IV. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
V. ආගමන සහ විගමන දෙපාර්තමේන්තුව
VI. ශ්‍රී ලංකා රේගුව

7. අනෙකුත් රාජ්‍ය පාර්ශ්වකරුවන්

I. කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභාව
II. මුදල් අමාත්‍යාංශය
III. ආරක්ෂක අමාත්‍යාංශය
IV. විදේශ කටයුතු අමාත්‍යාංශය
V. අධිකරණ අමාත්‍යාංශය
VI. ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුව
VII. නීතිපති දෙපාර්තමේන්තුව
VIII. රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය
IX. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
X. නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

8. වාර්තාකරණ ආයතන

මූල්‍ය බුද්ධි ඒකකය විසින් මුදල් ගනුදෙනු (CTRs) සහ විද්‍යුත් අරමුදල් පැවරුම් (EFTs) සඳහා වන වාර්තාකරණ අවශ්‍යතා පහත ආයතන සඳහා ඉදිරිපත් කර ඇත:

අ. මූල්‍ය ආයතන

i. බලපත්‍රලාභී වාණිජ බැංකු
ii. බලපත්‍රලාභී විශේෂිත බැංකු
iii. බලපත්‍රලාභී මූල්‍ය සමාගම්
iv. කොටස් තැරැව්කරුවන්
v. රක්ෂණ සමාගම්
vi. රක්ෂණ තැරැව්කරුවන්
vii. මුදල් හෝ වටිනාකම් හුවමාරු සේවා සපයන්නන්
viii. පරිසීමිත වෙළෙඳුන්
ix. ප්‍රාථමික අලෙවිකරුවන්
x. බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්
xi. සමූපකාර සමිති
xii. අතථ්‍ය වත්කම් සේවා සපයන්නන්

ආ. නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන්

i. මැණික් සහ ස්වර්ණාභරණ අලෙවිකරුවන්

ii. මූර්ත දේපළ නියෝජිතයන්

iii. කැසිනෝ

iv. නීතිඥයන්, නොතාරිස්වරුන් සහ අනෙකුත් ස්වාධීන නෛතික වෘත්තිකයන්

v. ගණකාධිකාරවරුන්

vi. භාර හෝ සමාගම් සේවා සපයන්නන්

තවද, මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතෙහි සඳහන් මූල්‍ය සහ **නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාරවල යෙදී සිටින සියලු** ම ආයතන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත ප්‍රකාර ව, සැක කටයුතු ගනුදෙනු වාර්තා ඉදිරිපත් කළ යුතු වේ.

9. ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය මැඩ පැවැත්වීමේ, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීමේ සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීමේ පාලන ව්‍යුහය

4 වන රූප සටහන: ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය මැඩ පැවැත්වීමේ, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීමේ සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීමේ පාලන ව්‍යුහය



10. නිගමනය

2026 – 2030 කාල පරිච්ඡේදය සඳහා මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ජාතික සම්බන්ධීකරණ කමිටුවේ මාර්ගෝපදේශය යටතේ සංවර්ධනය වූ අතර, එම කමිටුව විසින් එය ක්‍රියාත්මක කිරීමෙහි සම්බන්ධීකරණය, අධීක්ෂණය සහ ඇගැයීම සඳහා වන සමස්ත වගකීම දරනු ලබයි.

සියලු ම නම් කරන ලද ආයතන මෙම ජාතික ප්‍රතිපත්තියෙහි අරමුණු සහ ඉලක්ක ඔවුන්ගේ අදාළ ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායයන් සඳහා ඒකාබද්ධ කිරීම සහ ඒවා සාර්ථක ව සාක්ෂාත් කර ගැනීම තහවුරු කර, එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩ පැවැත්වීම පිළිබඳ රාමුවෙහි ශක්තිමත් භාවයට දායක වනු ඇතැයි අපේක්ෂා කෙරේ.